# මාසික මහ සභා රැස්වීම - 2022/02/08 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/02/08 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 47 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තැව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 47 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත් , මාධ්‍යවේදී සහෝදරයිනුත්, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

**01.** **<u>2022/01/11 දින මහ සභා වාර්තාව ස්ථිර කිරිම.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.01.11 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදි තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරිමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.01.11 දින පැවති VI වන සැසිවාරයේ 46 වන මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>2022.01.11 දින කල් තබන ලද 2022/01/25 මහ සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරිම.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.01.11 දින කල් තබන ලද 2022/01/25 මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදි තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරිමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.01.11 දින කල් තබන ලද 2022/01/25 මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන - නැත</u>

ඒ අනුව, 2022.01.11 දින පැවති VI වන සැසිවාරයේ 46 වන මහ සභා රැස්වීම් වාර්තාව සහ 2022.01.11 දින කල් තබන ලද 2022/01/25 මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02.**<u>ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**02.1 -** අපේ ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රී ගරු නාරද සිරිවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කරුණාරත්න මැතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා කිහිපදෙනෙකු මේ වන විට අසනීප තත්වයෙන් පසුවී සිට සුවය ලබමින් සිටිනවා. ඒ සියළු දෙනාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමට අපි කෙටි නිශ්ශබ්දතාවයක් පවත්වමු යැයි ඉල්ලා සිටිනවා. (ඒ අනුව විනාඩියක පමණ කෙටි නිශ්ශබ්දතාවයක් පවත්වන ලදි.)

**02.2 - අන්තර් ප්‍රාදේශීය සභා සුහදතා වර්ධනය කිරීමේ ක්‍රිකට් තරඟාවලිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ සහ නාරම්මල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය අතර සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණින් අලව්ව ප්‍රාදේශීය සභාවේ සුභසාධක මණ්ඩලය විසින් සංවිධානය කර ඇති ක්‍රිකට් තරඟාවලිය 2022.02.16 වන දින අලව්ව මහජන ක්‍රීඩාංගනයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහභාගීත්වය අපේක්ෂා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙය ඉතාම හොඳ කටයුත්තක්. මෙම තරඟාවලිය සඳහා අවශ්‍ය සංග්‍රහ කටයුතු මෙන්ම අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මුදල් යෙදවීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. එය ඉතාමත් හොඳ අදහසක්. එමෙන්ම අපේ මන්ත්‍රී මණ්ඩලයෙනුත් ක්‍රිකට් කණ්ඩායමක් මෙම තරඟාවලියට ඉදිරිපත් කරවීමට අවස්ථාව ලබා දෙනවා නම් ඉතාම හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අපේ සභාවේ මන්ත්‍රීවරු සහ නාරම්මල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් සමඟ සුහද ක්‍රිකට් තරඟයක් පැවැත්වීමට හැකියාවක් තිබෙනවා නම් ඒ සඳහා අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
එය හොඳ යෝජනාවක්. පසුගිය කාලයේ පැවති කොරෝනා උවදුරත් සමඟ අපි සියළු දෙනා ඉතා ආතතියකින් පසුවුනා. කාර්ය මණ්ඩලයත් මේ අවස්ථාව ලබා ගත්තේ එම නිසයි. අපේ සභාවේ සිටින මන්ත්‍රීවරු එකතු වී අසල්වාසී සභාවක මන්ත්‍රීවරුත් සමඟ එවැනි තරඟාවලියක් පැවැත්වීම හොඳ බව මමත් සිතනවා. සුහදතාවය වර්ධනය වීමටත් එය වඩාත් උපයෝගී වෙනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අපි නාරම්මල ප්‍රාදේශීය සභාවේ සිටින විට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සංවිධානය කර ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වූවා. එය ඉතාම සතුටුදායක කාරණයක්. ඒ අනුව මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව ලබා දෙනවා නම් ගොඩක් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එදා නාරම්මල ප්‍රාදේශීය සභාවට වඩා අද අපේ අලව්ව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් දක්ෂයි. හයේ හතරේ පාරවල් ගහන්න පුළුවන් මන්ත්‍රීවරුන් බොහොමයක් සිටිනවා. එම නිසා මෙම තරඟාවලිය සාර්ථක කරගැනීමට කටයුතු කරමු යැයි ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
මෙම තරඟාවලි දෙකම සම්බන්ධයෙන් සභාවෙන් විය යුත්තේ කුමක් ද යන්න සාකච්ඡා කර ඉදිරි කමිටුවකදී අපි තීරණයක් ගනිමු.

## **03.** <u>**ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**</u>

### <u>**03.1 ආණ්ඩුකරණය හා දේශපාලන පිළිබඳ උසස් සහතිකපත් පාඨමාලාව - 2022.**</u>
කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශය මගින් ආණ්ඩුකරණය හා දේශපාලන පිළිබඳ උසස් සහතිකපත් පාඨමාලාවක් හඳුන්වා දී ඇති අතර ඊට අදාල නිවේදනය 2022 ජනවාරි මස 09 වන දින ඉරිදා ලංකාදීප පුවත්පතෙහි පලකර ඇති බවත් මෙම පාඨමාලාව හැදෑරීමට උනන්දුවක් දක්වන පළාත් පාලන ආයතන වල නියෝජිතයන් හෝ

සේවකයන් මේ පිළිබඳව දැනුවත් කරන ලෙසත් දන්වා ඇති අතර පාඨමාලා ගාස්තුව රු. 70,000.00 වන බවත් අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2022 පෙබරවාරි මස 07 වැනි දින බවත් දන්වා ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම පාඨමාලාව ඉතාම හොඳ පාඨමාලාවක්. මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු උපාධිය දක්වා ඉදිරියට යාමේ හැකියාව තිබෙනවා. ඒ අනුව මෙම පාඨමාලාව හැදෑරීම සඳහා කැමැත්තක් ඇති මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අපේ සභාවේ තරුණ මන්ත්‍රීවරුන් ගොඩක් සිටිනවා. සභාවේ මූල්‍ය ශක්තිය අනුව මෙම පාඨමාලාව හැදෑරීම සඳහා එම මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබාදීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම පාඨමාලාව තුලින් දේශපාලනය පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. අළුත් මන්ත්‍රීවරුන්ට දේශපාලනය පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙනවා නම් හොඳ ඉදිරි ගමනක් යාමට හැකියි. එම අවස්ථාව ඔවුන්ට මේ තුලින් ලැබී තිබෙනවා. සභාවක් ලෙස අපි එම අවස්ථාව ලබා දෙමු.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
මෙම පාඨමාලාව හැදෑරීම සඳහා කැමැත්තක් දක්වන මන්ත්‍රීතුමන්ලා ඉල්ලුම් පත්‍රය ලබා ගෙන අයදුම් කරන්න.

**<u>03.2 සාක්ෂි මගින් සහ තාක්ෂණික විශේෂඥයින් විසින් මෙහෙයවනු ලබන නීති හරහා නාගරික අංශයේ මහජන සෞඛ්‍ය සහතික කිරීම.</u>**
වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්තුමා විසින් යොමු කර ඇති ලිපියට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක RAVE & UH/C/03/2021 සහ 2021.08.05 දිනැති ලිපිය සහ ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන යම් සංශෝධන යෝජනා ඇතුලත් ඇමුණුමක් යොමු කර ඇති බවත්, ඒ අනුව එකී යෝජිත සංශෝධන ප්‍රාදේශීය සභා පනතට ඇතුලත් කර සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මහා සභාව ද දැනුවත් කර ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පළාත් සභා හා පලාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමන් වෙත යොමු කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙසත් දන්වා ඇත. (මෙම සංශෝධන යෝජනා ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇත.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය සභා පණත අනුව අළුතින් බලප්‍රදේශයට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයෙකු පත් වූ විට සභාපතිවරයෙකුගේ බලතල අනුව සෞඛ්‍ය සම්බන්ධ යම් යම් දේවල් කිරීමේ බලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාට පවරනු ලබනවා. මෙම සංශෝධනය තුලින් උත්සාහ කරනු ලබන්නේ මෙම සෞඛ්‍ය සම්බන්ධ සම්පූර්ණ බලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය යටතට ගැනීමටයි. ප්‍රාදේශීය සභාවක් ලෙස බලප්‍රදේශය තුල කටයුතු කිරීමට පණතෙන් අපට ලබා දුන් බලය උදුරා ගැනීමටයි. මෙසේ බලතල උදුරා ගත් පසු සභාවක් අවශ්‍ය වන්නේ නැහැ. අපි කිසිවෙක් මෙම සභාව සතු බලතල වෙනත් ආයතනයකට පවරා උඩබලාගෙන සිටීමට ලෑස්ති නැහැ. අපේ බලතල යම් ප්‍රමාණයක් නාගරික සංවර්ධන අධිකාරිය මගින් උදුරා ගත්තා. ග්‍රාම සංවර්ධන කටයුතු වල සිටින නිලධාරීන් යම් බලතල ප්‍රමාණයක්

උදුරාගෙන තිබෙනවා. සුසාන භූමි වල අයිතිය මෙන්ම මාර්ග වල අයිතියත් අපෙන් ගිලිහී යන තත්වයක තිබෙනවා. මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ගෙන ආ විට එය නිලධාරීන් විසින් ගණන් නොගෙන පහතට දමනවා. එම නිසා මෙම සංශෝධනය කිරීමට අපගේ දැඩි විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය සභා සතුව එදා තිබුණු බලතලයි අද තිබෙන බලතලයි අතර ලොකු වෙනසක් තිබෙනවා. එදා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට බලප්‍රදේශයේ ප්‍රධාන විධායකය ලෙස විශාල බලයක් තිබුනා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ගම් 10 ක් 15 ක් නියෝජනය කලා. අදටත් වඩා ඉදිරියේදී මේ ප්‍රාදේශීය සභාවේ ඉඳගන්න මහජන නියෝජිතයින්ට අපි මේ බලතල රැකදිය යුතුයි. අපට තිබෙන බලය කිසිවෙකුටත් ලබා ගැනීමට ඉඩදෙන්න එපා. එයට අපි විරුද්ධයි. අද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා පත්වී සිටින තත්වය අපි හොඳින්ම දන්නවා. ඇතැම් නිලධාරීන් අපිට නියෝග කරන තත්වයට පත්වී තිබෙනවා. දැනට ප්‍රාදේශීය සභාව සතු බලය පමණක් නොව අපෙන් ගිලිහී ගිය බලයත් නැවත ප්‍රාදේශීය සභාව සතු කර ගැනීමට කටයුතු කල යුතුයි. අපිට බලවත් පණතක් තිබෙනවා. පණත ප්‍රකාරව අපි වැඩකටයුතු කල යුතුයි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පාලනය වන්නේ ප්‍රාදේශීය සභාව යටතේයි. අවසාන වශයෙන් ප්‍රකාශ කරන්නේ මෙම උත්තරීතර ආයතනයට තිබෙන බලය ගිලිහී යාමට ඉඩ නොතබන ලෙසයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය සභා පණතේ අපිට හිමි බලතල යම් යම් ආයතන ප්‍රධානීන් විවිධ ආයතන වලට පවරා ගන්නා අවස්ථා අපි දැක තිබෙනවා. අපි සැම කෙනෙක්ම ඒ වෙනුවෙන් හඬ නගලා තිබෙනවා. අපේ සභා බල ප්‍රදේශයේත් මෙවැනි ගැටළු කිහිපයකටම මීට පෙර අපි මුහුණ දී තිබෙනවා. දිවංගත රණසිංහ ප්‍රේමදාස ගරු ජනාධිපතිතුමා නාගරික මන්ත්‍රීවරයෙක් ලෙස දේශපාලන බිමට පිවිසිලා නියෝජ්‍ය ඇමතිවරයෙක්, ඇමතිවරයෙක්, අග්‍රාමාත්‍යවරයෙක් සහ ජනාධිපතිවරයෙක් ලෙස මහජන අත්දැකීම් සම්භාරයක් හරහා ලබා ගත් දැනුමෙනුයි මෙම පණත සකස් කලේ. අද ග්‍රාමීය ජනතාවට කොන්ද කෙලින් කරගෙන කටයුතු කරන්න පුළුවන් අවස්ථාවක් ලැබී තිබෙන්නේ මෙම පණත තුලිනුයි. මෙම බලගතු පණත තුලින් විධායක ජනාධිපතිට හා සමාන බලතල සභාවට පැවරී තිබෙනවා. එය අභියෝගයට ලක් කිරීමට කිසිම ආයතනයකට හෝ අධිකරණයකට පුළුවන්කමක් නැහැ. නමුත් යම් යම් ආයතන විසින් මෙම බලතල උදුරා ගැනීමට උත්සාහ කරන අවස්ථා අප දැක තිබෙනවා. මෙම සංශෝධනය රජය දැනගෙනම යොමු කල සංශෝධනයක්. මෙම පණත වෙනස් කර අප ගම් වල ජනතාවගේ තිබෙන බලතල අනිසි ලෙස මධ්‍යම රජයට පවරා ගැනීමට රජයට අවශ්‍යතාවයක් තිබෙන බවයි පෙනීයන්නේ. රජයට අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය සභා පණත අහෝසි කර දමා 3 න් 2 බලයෙන් වෙනත් පණතක් ගෙන ඒමට වුවත් හැකියාව තිබෙනවා. නමුත් එසේ නොකරන්නේ මෙම පණත ජනතාවට කාවැදුනු පණතක් නිසයි. කෙසේ වුවත් මෙම මහජන ආයතනය දීර්ඝකාලයක් නියෝජනය කල නියෝජිතයෙක් ලෙස මෙම සංශෝධන යෝජනාව පිළිකුලෙන් යුතුව හෙලා දකිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, නාගරික සංවර්ධන අධිකාරිය අපේ බලය උදුරා ගන්නා විට එයට විරුද්ධවත් අපි කතා කලා. ප්‍රාදේශීය සභාව සතු බලතල යම් යම් ආයතන විසින් උදුරා ගන්නවාට අපි කවදාවත් කැමති වුනේ නැහැ. දිවංගත ගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා බිම් මට්ටමේ සිට පැමිණි නායකයෙක් ලෙස ජනතාවගේ සිතුම් පැතුම් හොඳින් තේරුම් ගත් නායකයෙක් ලෙස මේ පළාත් පාලන පණත අපිට හඳුන්වා දුන්නා. එතුමා දිවංගත වීමට පෙර මහේස්ත්‍රාත්වරයෙක්ගේ බලතල ප්‍රාදේශීය සභා සභාපතිවරයෙක්ට ලබා දීමට සිටිය බව

මම අසා තිබෙනවා. එසේ සිදුවුනා නම් අද අපිට මුහුණ දීමට සිදුවී තිබෙන ප්‍රායෝගික ගැටළු වලට මුහුණ දීමට සිදුවන්නේ නෑ. නමුත් එතුමාට එය සිදුකරගැනීමට නොහැකි වුනා. මේ රටේ නීති හදන ආයතන තුනෙන් එකක් වන්නේ ප්‍රාදේශීය සභාවයි. යම් බලතල ප්‍රමාණයක් පළාත් සභාව අපෙන් අරගනු ලැබුවා. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියත් අපෙන් යම් බලතල ප්‍රමාණයක් ලබාගත්තා. අද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය තවත් බලතල ප්‍රමාණයක් ලබාගැනීමට සූදානම් වෙනවා. අපේ බලප්‍රදේශයේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් අපිට සතුටු විය නොහැකියි. එවැනි තත්වයක් තුල ප්‍රාදේශීය සභාව සතු බලතලත් ඔවුන්ට ලබාදීම අනුමත කල නොහැකියි. කොරෝනා උවදුරේදී ප්‍රාදේශීය සභාවක් ලෙස කල හැකි වාහන, තෙල්, ප්‍රචාරක කටයුතු ආදී සියළුම දේ අපි විසින් ඉටු කලා. එසේ තිබියදීත් මෙම බලතල අපෙන් ගැනීමට සූදානම් වන්නේ ඉහළ පැලැන්තියට හීනමානයක් තිබෙන නිසයි. අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමේ හෝ අපේ බලතල නැවත ලබා ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක මෙම සංශෝධනය ගෙන ඒම අමනෝඥම තීන්දුවක් ලෙස මා දකිනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයට දීමට හැකි උපරිම සහයෝගය අපි ලබාදෙනවා. එම නිසා මෙම සංශෝධනය කිරීම සම්බන්ධව අපගේ දැඩි විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම සංශෝධනය තුලින් කිරීමට උත්සාහ කරන්නේ ප්‍රාදේශීය සභාව සතු බලතල නැවත මධ්‍යම රජයට පවරා ගැනීමටයි. ප්‍රාදේශීය සභා පණතට අනුව ප්‍රාදේශීය සභාව සමඟ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සම්බන්ධ කර තිබීමෙන් සෞඛ්‍ය ගැටළුවක් පැන නැගුණු මොහොතක ක්ෂණිකව මුදල් වෙන් කර ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා කටයුතු කල හැකියි. එමෙන්ම රාජ්‍ය නිලධාරීන් අතින් මහජනයාට අකටයුතුකමක් සිදුවෙනවා නම් ඒ පිළිබඳව කතා කිරිමේ අයිතිය ජනතා නියෝජිතයින්ට තිබිය යුතුයි. එමෙන්ම වෙළඳ බලපත්‍ර ආදී දේවල් ප්‍රාදේශීය සභාවත් සමඟ එකට යන කාරණායි. මෙවැනි සංශෝධනයක් සිදු කිරීමෙන් මහජනයාට අකටයුතුකමක් කලත් ඒ සම්බන්ධයෙන් කතා කිරීමේ අයිතිය ජනතා නියෝජිතයින්ට අහිමි කර තිබෙනවා. එමෙන්ම ඔවුන්ගේ කටයුතු වලට මුදල් නොමැති වුවහොත් ඔවුන් වැඩ නොකර හිඳීවි. එමෙන්ම අපේ වෙළඳ බලපත්‍ර ආදිය ප්‍රමාද වුවත් අපිට කල හැකි දෙයක් නොමැතියි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය අපි යටතේ තිබිය යුතු ආයතනයක් නොවෙයි. නමුත් අපිත් සමඟ බද්ධ වී යා යුතු ආයතනයකුයි. එය වෙනස් කලහොත් සමාජයටත් කවදා හෝ එම පීඩනය දැනේවි. එම නිසා මෙම සංශෝධනය සිදු කිරීම නුසුදුසුයි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට ගෞරවයක් ලබා දුන්නේ මෙම ප්‍රාදේශීය සභා පණත තුලිනුයි. දිවංගත ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මෙම පණත ගෙන ඒම තුලින් රටට විශාල සේවයක් කලා. අද වන විට ජනතා නියෝජිතයාත් නිලධාරියාත් අතර ගැටුමක් තිබෙනවා. පාර්ලිමේන්තුව තුලින් මුළු රටටම බලපාන තීන්දු තීරණත් පළාත් සභාව තුලින් පළාතට බලපාන තීන්දු තීරණත් ප්‍රාදේශීය සභාව තුලින් බලප්‍රදේශයට බලපාන තීන්දු තීරණත් ගනු ලබනවා. ඒ අනුව ග්‍රාමීය ජනයා වෙනුවෙන් කතා කිරීමට තිබෙන තැන ප්‍රාදේශීය සභාවයි. මේ තුලින් උල්ලංඝණය කරනු ලබන්නේ එහි බලතලයි. ප්‍රාදේශීය සභා පණත විටින් විට නොයෙකුත් හැල හැප්පීම් වලට භාජනය වුනා. විවිධ ආයතන විසින් ප්‍රාදේශීය සභාවේ බලතල පැහැරගනු ලැබුවා. මෙය සමස්ත ලංකාවේම ප්‍රාදේශීය සභා වලට බලපාන ප්‍රශ්නයක්. එම නිසා අපි මෙම සෞඛ්‍ය අංශ වලට අපේ බලතල ලබා දීමට විරුද්ධයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම සංශෝධනය ජනතා නියෝජිතයින්ගේ බලතල අඩු කිරීමට යෙදූ උපක්‍රමයක්. ප්‍රාදේශීය සභාවේ සිටින්නේ ගම ගොඩනගන ජනතා නියෝජිතයො යි. අද මන්ත්‍රීවරයෙක් ලෙස ගරුත්වයක් ඇතිව මෙතන සිටින්නේ දිවංගත ගරු ප්‍රේමදාස මැතිතුමා

විසින් මෙම පණත ගෙන ආ නිසයි. නමුත් දැන් අපේ බලතල ටිකෙන් ටික විවිධ ආයතන විසින් පැහැරගනු ලබනවා. ප්‍රාදේශීය සභාව විසින් මෙතෙක් කාලයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ කටයුතු වලට විශාල කැපවීමක් කරමින් ඉතා හොඳින් සහයෝගය ලබා දී තිබෙනවා. මෙම සංශෝධනයට අපේ බලවත් විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ප්‍රාදේශීය සභා පණත තුල ජන ජීවිතයේ සෑම අංගයක් ම ඇතුලත් වන පරිදි ඒවාට කටයුතු කල යුතු ආකාරය සහ කර්තව්‍යන් පිළිබඳව ඇතුලත් වී තිබෙනවා. පණතක් සකස් කල විට එය විවිධ අවස්ථා වලදී සංශෝධනය වෙනවා. එය සංශෝධනය විය යුත්තේ එය ක්‍රියාත්මක කරන අය හෝ ජනතාව අපහසුතාවයට පත් වීමට නොව තව තවත් ශක්තිමත් වීම සඳහායි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණතේ 78 වගන්තියේ මේ වන විටත් සෞඛ්‍ය සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පැහැදිලිව සඳහන් කර තිබෙනවා. මෙහිදී අපේ අදහස් විමසා තිබෙනවා. එසේ නම් අපි සභාවක් ලෙස ජනතාවට සමීපව කටයුතු කරන ජනතා නියෝජිතයින් ලෙස එමෙන්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට වැඩිම සහයෝගයක් ලබා දෙන ආයතනය ලෙස මෙම සංශෝධනය කිරීම සම්බන්ධව අපේ එකඟත්වයක් නොමැති බව ප්‍රකාශ කරනවා.

**03.3 සුරකිමු ගංගා වැඩසටහන යටතේ නව ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම පිළිබඳව.**

සුරකිමු ගංගා වැඩසටහන යටතේ නව ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමට අදාලව අලව්ව ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංක කුරු/අල/ප/3/1/152 හා 2022.01.17 දිනැති ලිපිය අනුව 2021.12.10 දින පැවති සුරකිමු ගංගා ප්‍රාදේශීය කමිටුවේදී තීරණය කල පරිදි 2022 වසර සඳහා මා ඔය ආශ්‍රිතව නව ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම සඳහා අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අලව්ව ප්‍රාදේශීය සභාව හා මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතන වල සහභාගීත්වයෙන් 2022.01.22 දින මා ඔය ආශ්‍රීතව ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකල බවත් එහිදී අලව්ව නාගරික සීමාව තුල මා ඔය ආශ්‍රිතව විවිධ කර්මාන්ත හා ක්‍රියාකාරකම් ඇතුලත් ස්ථාන පරීක්ෂණයට ලක් කර එම ක්‍රියාකාරකම් මගින් මා ඔය ට සිදු වන පාරිසරික හානීන් නිරීක්ෂණය කර ඇති බවත් එහිදී තීරණය කල පරිදි එම විවිධ භාවිතයන් හා ක්‍රියාකාරකම් මගින් මා ඔය ට සිදු වන පාරිසරික හානීන් අවම කිරීම සඳහා නිරීක්ෂණ චාරිකාවේ කරුණු ඇතුලත් සංක්ෂිප්ත වාර්තාවක් අලව්ව ප්‍රාදේශීය සභාවට යොමු කිරීමට තීරණය කරන ලද අතර ඒ අනුව මා ඔය අසල පිහිටි නිවාස සහ පහත සඳහන් ස්ථාන මගින් සිදු කරන විවිධ ක්‍රියාකාරකම් මගින් මාඔය ට සිදු වන පාරිසරික හානීන් අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස දැනුම් දෙමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් යොමු කර ඇති ලිපිය.

| අනු අංකය | ස්ථානය | පාරිසරික දූෂණ තත්වය (මා ඔයට සිදුකරන බැහැර කිරීම්) |
|---|---|---|
| 01 | මා ඔයට ජලය ගලා බසින අලව්ව දුම්රිය ස්ථානය අසල පිහිටි ප්‍රධාන ඇල මාර්ගයට අලව්ව නගරය හරහා ගලා බසින කාණු පද්ධතිය මගින් සිදු වන බැහැර කිරීම්. | නගරය ඇතුළු අනෙකුත් ස්ථාන මගින් පොලිතීන්, ප්ලාස්ටික් මිශ්‍ර ඝණ අපද්‍රව්‍ය, ඉවුරු ඛාදනය |
| 02 | ආකාශ් සේවා ස්ථානය, යාංගල්මෝදර, අලව්ව | කාර්මික අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 03 | වික්‍රම හෝටලය, කොලඹ පාර, අලව්ව | ගෘහස්ථ අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 04 | ජෙමලයිට් හෝටලය, කොලඹ පාර, අලව්ව | ගෘහස්ථ අපජලය, ඝණ අපද්‍රව්‍ය |

| | | |
|---|---|---|
| 05 | රිවර් සයිට් හෝටලය, කොලඹ පාර, අලව්ව | ගෘහස්ථ අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 06 | වෙදගෙදර උපකාරක පන්තිය, කොලඹ පාර, අලව්ව | ගෘහස්ථ අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 07 | අමරසිංහ මෝටර්ස්, කොලඹ පාර, අලව්ව | කාර්මික අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 08 | ජී.පී. ලෝරන්ස් ගරාජය, කොලඹ පාර, අලව්ව | කාර්මික අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 09 | සංජීව සේවා ස්ථානය, කොලඹ පාර, අලව්ව | කාර්මික අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 10 | ජය ශ්‍රී ඔටෝ ඉන්ජිනියරින්, කොලඹ පාර, අලව්ව | කාර්මික අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 11 | තරුෂ රිවර් ඉන් හෝටලය, කොලඹ පාර, අලව්ව | ගෘහස්ථ අපජලය, ඝණ අපද්‍රව්‍ය |
| 12 | මා ඔය අසල පිහිටි නිවාස | ගෘහස්ථ අපජලය, ඝණ අපද්‍රව්‍ය |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ස්ථාන සම්බන්ධයෙන් නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීමට මත්තෙන් ඔවුන්ව ඒ සම්බන්ධව දැනුවත් කර එම අපජලය නිසි පරිදි බැහැර කිරීමට උපදෙස් දෙමු. එමෙන්ම නගරය මැදින් යන ඇල මාර්ග දෙකම වැසි ජලය බැසීමට පැවතුනත් ඇතැමුන් එම ඇල මාර්ග වල කොටසක් ආක්‍රමණය කර තිබෙනවා. නගරයේ සියළුම අපජලය හරවා තිබෙන්නේ මෙම ඇල මාර්ගයටයි. මේ පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් සහ සභාවේ නිලධාරීන් ගොස් කිහිප වතාවක්ම දැනුවත් කලා. එම නිසා ඒ සම්බන්ධවත් තීරණයක් ගැනීම සුදුසු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම නිවාස වලට, කර්මාන්තකරුවන්ට මෙන්ම වෙලඳ ව්‍යාපාරිකයින්ට ඕනෑම අපද්‍රව්‍යක් ක්‍රමානුකූලව පරිසරයට බැහැර කිරීමේ හැකියාව තිබෙනවා. නමුත් මොවුන් තම ලෙහෙසිය පහසුව තකා මෙම අපජලය මා ඔයට මුදා හරිනවා. මේ රට දියුණු වීමට කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර තිබිය යුතුයි. නමුත් ඒවා ක්‍රමවත්ව පවත්වා ගත යුතුයි. අපජලය පිරිසිදු කිරීමේ ක්‍රම බොහොමයක් තිබෙනවා. අපිට ඒවා යොදාගෙන මෙම අපජලය පිරිසිදු කර ගැනීමේ හැකියාව තිබෙනවා. එම නිසා සභාවක් ලෙස මැදිහත් වී මොවුන් කැඳවා අවශ්‍ය නිර්දේශ ලබා දී තමන්ගේ කර්මාන්තය පරිසරයට හානියක් නොමැතිව කරගෙන යාමට අවශ්‍ය නිර්දේශ ලබා දෙමු.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පරිසරය ආරක්ෂා කරගත යුත්තේ මිනිසා විසින්මයි. නමුත් නගර වල මෙන්ම ගම් වලත් ඇල මාර්ග වලට, ඔයවල් වලට අපද්‍රව්‍ය මුදා හැරීම දක්නට ලැබෙනවා. මෙලෙස ක්‍රියා කරන්නේ බුද්ධියක් සහ සදාචාරයක් නොමැති මිනිසුනුයි. මෙය ජාතික වශයෙන්ම නීතිමය පියවරක් ගෙන දඬුවම් දීමෙන් නැවැත්විය යුතු කාරණයක් ලෙස මා දකිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය සභාවක් ලෙස නගරයේ සිටින කර්මාන්තකරුවන් සහ ව්‍යාපාරිකයින් අපිට අවශ්‍යයි. නමුත් පරිසර හානියත් වැරදියි. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීනුත්, ඔබතුමිය ප්‍රධාන සභාවේ නිලධාරීන් එකතු වී මෙම ඉදිරිපත් කරන ලද ස්ථාන වල පුද්ගලයින් ගෙන්වා හිත් අමනාපකම් ඇති කර ගන්නේ නැතිව අවශ්‍ය දැනුවත් කිරීම් කර මෙම ක්‍රියාවන් වලක්වා ගැනීමට ක්‍රමවේදයක් යොදා ගැනීම සුදුසු බව මා සිතනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අපි මෙවැනි අවස්ථාවක දී අදාල නීතිමය පියවර ගැනීමට හදිසි වන්නේ නැහැ. පරිසර කමිටුව සහ අපේ නිලධාරීන් යවා වාර්තාවක් ලබා ගෙන ඒ අනුවයි අපි ක්‍රියාත්මක වන්නේ. ඒ අනුව අපේ පරිසර නිලධාරීන්ව යොමු කර වාර්තාවක් ලබා ගෙන මේ පිළිබඳව පරිසර කමිටුවේදීත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව තීරණයක් ගනිමු. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වාරි මාර්ග දෙපාර්තමේන්තුවට සහ පොලිස් ස්ථානයට මෙම ලිපියේ පිටපත් යොමු කර තිබෙනවා. එම ආයතනවලිනුත් විවිධ අදහස් අප වෙත ඒවි. මෙහි වගකීම ප්‍රාදේශීය සභාව සතු නිසා එම ආයතන වල අදහසුත් ගොනු කරගෙන අපි නැවත වරක් සාකච්ඡා කර හොඳ වැඩපිළිවෙලක් යොදා ගමු.

**<u>03.4 ස්ථාවර වත්කම් තහවුරු කර ගැනීම සඳහා.</u>**

ස්ථාවර වත්කම් තහවුරු කර ගැනීම සඳහා අප විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලද ලිපියට පිළිතුරක් වශයෙන් එවා ඇති ලිපියට අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ කැප්පිටිවලාන උප කාර්යාලය පිහිටි භූමියේ ඊට උතුරට මායිම් වූ වරිපණම් අංක 115 දරණ භූමිය එවකට මාර්ග සංවර්ධන අධිකාරිය සතු දේපලක් බව දන්වා ඇති අතර මෙම දේපල පිළිබඳව අප විසින් යොමු කරන ලද තොරතුරු වලට අනුව එවකට බලධාරීන්ව සිටි පාර්ශවයන් විසින් කැප්පිටිවලාන ගම් සභා කාර්යාලය සතු දේපල සහ එවකට මාර්ග සංවර්ධන අධිකාරිය සතු දේපලක් බව පවසන කොටස එකඟතාවයක් යටතේ හුවමාරු කර ගැනීමේ පදනමක් මත කටයුතු කර ඇති බවත් මෙම දේපළ නීත්‍යානුකූල ලියවිල්ලකින් කැප්පිටිවලාන ගම් සභා කාර්යාලය වෙත පවරා ඇති බවත් සඳහන් කර ඇති අතර අප විසින් ඉල්ලීම් කරන මෙම දේපල කැප්පිටිවලාන ගම් සභා කාර්යාලය වෙත පැවරූ ආකාරය පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය සතු ස්ථාවර වත්කම් ලේඛනයේද කිසිදු සටහනක් නොමැති බව දන්වා ඇත. එබැවින් මේ පිළිබදව පරික්ෂා කර බලා නීත්‍යානුකූල පැවරුම් පත්‍රයක් මගින් හෝ මේ කරුණට අදාල කිසියම් විස්තර සටහනක් හෝ ඇත්නම් අප සභාව වෙත යොමු කිරීම සඳහා ලබා දෙන මෙන් ඉල්ලීමක් කරමින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ලිපිය අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කර තිබෙනවා. එහි පිටපතක් අප වෙත ද යොමුකර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා කර මෙම දේපලෙහි අයිතිය නීතිමය වශයෙන් නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ඉඩම මහා මාර්ග දෙපාර්තමේන්තුවේ උප ශාඛාවක් ලෙස කාලයක් පාවිච්චි කලා. ඊට ප්‍රථමව එවකට ගම් සභා සභාපතිව සිටි වෛද්‍යාරත්න මහතාත්, පී.බී. වැත්තැව මැතිතුමාත් මැදිහත් වී මෙම ඉඩම කැප්පිටිවලාන උප කාර්යාලයට ලබා ගනු ලැබුවා. මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරාගෙන උප කාර්යාල ගොඩනැගිල්ල ඉදි කරනු ලැබුවා. පසුව මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ ඒකකයක් දැමීම සඳහා මෙම ඉඩම් කොටස ලබා දුන්නේ ප්‍රාදේශීය සභාව දැනුවත්වයි. එම නිසා මෙම ඉඩමේ මුල් අයිතිය ප්‍රාදේශීය සභාව සතුයි. දැන් එම මාර්ග සංවර්ධන අධිකාරියේ නඩත්තු කාර්යාලය නොමැති නිසා ප්‍රාදේශීය සභාවට පූර්ණ අයිතිය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. නැබඩවතුර ප්‍රදේශයේ පොලිස් ස්ථානය ස්ථාපිත කරන විට අපි විසින් ඉලක්ක කරගෙන තිබුනේ මෙම භූමි භාගයයි. නමුත් සභාව වත් දැනුවත් නොකොට පොලිස් ස්ථානය නැබඩවතුර ප්‍රදේශයේ ස්ථාපිත කලා. නමුත් ඒ සඳහා ඉතා සුදුසු ස්ථානය මෙම ඉඩමයි. කෙසේ වෙතත් මෙම ඉඩමේ මුල් අයිතිය භුක්ති විඳි බව සඳහන් කර දැනට නීත්‍යානුකූලව සභාවටම අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අපි දන්නා කාලයේ සිටම මෙම ඉඩම පරිහරණය කලේ ප්‍රාදේශීය සභාවයි. දිවංගත පී.බී. වැත්තෑව මැතිතුමා, වෛද්‍යරත්න මැතිතුමා වැනි මැතිතුමන්ලා විසින් මෙම ඉඩම ලබාගෙන ඉදිරි පරපුර වෙනුවෙන් මෙම සභාව සඳහා මෙම ඉඩම ආරක්ෂා කර තිබෙනවා. එම නිසා මෙය නීත්‍යානුකූලව අලව්ව ප්‍රාදේශීය සභාව සතු කරගෙන එම භූමි භාගය තුල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් වැනි මහජනතාවගේ උන්නතිය වෙනුවෙන් කටයුතු කල හැකි ආයතනයක් මෙන්ම සභාවට ආදායමක් ලැබෙන කටයුත්තක් සිදු කිරීම සුදුසු වෙනවා.

**<u>03.5 ඕබඩගෙදර හරහා බෝගහවත්ත මාර්ගය සම්බන්ධවයි.</u>**
මීරිගම කුරුණෑගල අධිවේගී මාර්ග ව්‍යාපෘති කටයුතු වලදී අබලන් වී ඇති ඕබඩගෙදර හරහා බෝගහවත්ත මාර්ගය සම්බන්ධයෙන් අප විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලද ලිපිය එම අධිකාරිය විසින් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 02, බී කොටසෙහි ව්‍යාපෘති ඉංජිනේරු වෙත ඉදිරිපත් කල ලිපියෙහි පිටපතක් අප වෙත එවා තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙවැනි මාර්ග ගැටළු වලදී අදාල ව්‍යාපෘතිය විසින්ම එම මාර්ග සංවර්ධනය කර දීම ඉතාම හොඳයි. එය විය යුතු කටයුත්තක්. එවිට අධිවේගී මාර්ගය සංවර්ධනය වන විට ඒ ආශ්‍රිත මාර්ගත් සංවර්ධනය වෙනවා. එම කටයුත්ත හැකි ඉක්මනින් කර දෙන ලෙස නැවත වතාවක් ඉල්ලීමක් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, අධිවේගී මාර්ගය ඉදිකිරීමට අවශ්‍ය බඩුබාහිරාදිය ප්‍රවාහනය කිරීම මෙම මාර්ගය අබලන් වීමට එක් හේතුවක් වුනා. මෙම මාර්ගයේ එක් පැත්තක වෙල් යාය නිසා බර වාහන යන විට මාර්ගය බැසීමට ලක් වෙනවා. මාර්ග සංවර්ධන අධිකාරියෙන් මෙම මාර්ගය හදනවා නම් වෙල් යාය පැත්තෙන් පැතිබැම්මක් හෝ යොදා සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරනවා. එමෙන්ම මෙම මාර්ගයේ එක් ස්ථානයක පාර මැද ලයිට් කණුවක් තිබෙන බවත් එය ඉවත්කර දෙන ලෙසත් මමත්, රාජපක්ෂ මන්ත්‍රීතුමියත් දෙදෙනාම ඉල්ලීම් කලා. ඒ අනුව එම ලයිට් කණුව පවතින ස්ථානයෙන් ඉවත්කර මාර්ගය අයිනෙන් ස්ථාපිත කර මාර්ග සංවර්ධන අධිකාරියට භාර දුනහොත් එම සංවර්ධන කටයුත්ත සාර්ථක වේවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අධිවේගී මාර්ගය සංවර්ධනය කිරීමේදී භාවිතා කරන මාර්ග කැඩුණහොත් අවශ්‍ය කරන කාපට් හෝ තාර යොදා සම්පූර්ණ නවීකරණය කර දෙන බවට අපිට පොරොන්දු වී තිබෙනවා. ඒ අනුව මෙම මාර්ගයට අමතරව තවත් එවැනි මාර්ග කිහිපයක් තිබෙනවා. ඒවා සම්බන්ධවත් ඔබතුමියගේ අවධානය යොමු කර අදාල කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මේ වන විට අපේ ප්‍රදේශ වල බොහොමයක් මාර්ග කාපට් යොදා සංවර්ධනය කර තිබෙනවා. නමුත් ටිපර් රථ ධාවනය වන නිසා මේ මාර්ගවලට හානි සිදුවෙනවා. එම නිසා අපේ සභාවේ වියදමෙන් හෝ මේ මාර්ග වලට බර සීමා පුවරු ටිකක් යොදමු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**
ගරු සභාපතිතුමියනි, මේ මාර්ග සම්බන්ධයෙන් ගරු ජොන්ස්ටන් ඇමතිතුමාගේ අවධානය යොමු කර තිබෙනවා. මෙම මාර්ගයේ මැද තිබෙන විදුලි කණුව ඉවත් කර දෙන ලෙසට මා

ඉල්ලීම් කිහිපයක්ම යොමු කලා. විදුලි ඉංජිනේරුතුමා එය ඉවත් කරන බව පැවසුවත් මේ වන තුරුත් එය සිදුවුනේ නැහැ. එම නිසා එය ඉවත් කර දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙම විදුලි කණුව ඉවත් කිරීම සම්බන්ධයෙන් මන්ත්‍රීතුමිය විසින් යොමු කල ඉල්ලීම විදුලි බල මණ්ඩලයට යොමු කර තිබෙනවා. නමුත් ඒ පිළිබඳව අපිට කිසිදු ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. අප නැවතත් ඒ පිළිබඳව විදුලි බල මණ්ඩලයට සිහිපත් කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වීරවංශ මන්ත්‍රීතුමා පැවසුවා මෙන්ම මේ වන විට ග්‍රාමීය මට්ටමේ මාර්ග කාපට් සහ කොන්ක්‍රීට් යොදා ඉතා වටිනා ලෙස සකස් කර තිබෙවා. නමුත් ප්‍රධාන වශයෙන්ම කොට ඇදීම නිසා මෙම කොන්ක්‍රීට් සහ කාපට් පුපුරා යනවා. මේ පිළිබඳව අවධානය යොමු කර සෑම ග්‍රාමීය අතුරු මාර්ගයකටම සභාව මගින් බර සීමා පුවරු දැමීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අධිවේගී මාර්ගය හා සම්බන්ධ වන අපේ ප්‍රදේශ වල තිබෙන මාර්ගත් ප්‍රතිසංස්කරණය කර දීමට මාර්ග සංවර්ධන අධිකාරිය යොමු වී තිබෙනවා. මෙම ඕබඩගෙදර හරහා බෝගහවත්ත මාර්ගය බොහෝ ජනතාවක් පාවිච්චි කරන මාර්ගයක් නිසා මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධ වී එය ඉක්මනින් සංවර්ධනය කර දීමට කටයුතු කරමු.

**<u>03.6 දුම්රියපොල පටුමග (ඕවිටවත්ත මාර්ගය) පිවිසුම යථා තත්වයට පත් කර ගැනීම.</u>**

අලව්ව නගරයේ මාර්ග සංවර්ධන කටයුතු හේතුවෙන් අලව්ව කොස්ගහමුල කඩේ සහ රණසිංහ බයිසිකල් කඩය අතරින් පහළට දිව යන අලව්ව දුම්රියපොල පටුමගේ පිවිසුම දුහුවිල්ලෙන් පිරී පවතින බවත් කොන්ක්‍රීට් කර තිබූ දිග අඩි 20 ක් හා පළල අඩි 14 ක් පමණ වන එම මාර්ගයේ පිවිසුම නැවත යථා තත්වයට පත් කර ලෙසත් ඉල්ලීමක් කරමින් ගරු විපක්ෂ නායක මොහාන් වික්‍රමනායක මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙම කාරණය පිළිබඳව මීට කලිනුත් ලිපියක් කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර එම ස්ථානය ප්‍රතිසංස්කරණය කර දීමට තීන්දුවකට පැමිණියා. නගරයේ පිවිසුම් මාර්ගයක් නිසා එය සිදුකිරීම අවශ්‍ය කටයුත්තක්.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, දුම්රිය ස්ථානයට ගමන් කිරීම සඳහා විශාල පිරිසක් මෙම මාර්ගය භාවිතා කරනවා. එම නිසා මෙම මාර්ගයේ පිවිසුම යථා තත්වයට පත් කිරීම ඉතාම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව නගර සංවර්ධන කටයුතු වලදී වෙළඳ ව්‍යාපාරිකයින්ගේ සහයෝගය අලව්ව ප්‍රාදේශීය සභාවට ඉතා හොඳින් ලබා දුන්නා. එවකට ශාන්ත බණ්ඩාර මැතිතුමා විසින් මෙම මාර්ගයේ මුල් කොටස කොන්ක්‍රීට් කරනු ලැබුවා. මෙසේ ගලවා ඉවත් කර තිබෙන්නේ එහි ඉදිරි කොටසයි. එමෙන්ම මීට ඉහතදී මෙම මාර්ගයේ පිවිසුම් කොටසේ දෙපැත්තෙන් අඩි දෙක බැගින් ලබා දී සංවර්ධනය කර දෙන ලෙස ගම්වාසීන් විසින් ඉල්ලීමක්

කර තිබුනා. ඒ අනුව කාර්මික නිලධාරී මහතෙකු සම්බන්ධ කර මෙම අඩි 20 ක පමණ ප්‍රමාණය කොන්ක්‍රීට් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>03.7 මා ඔය හරහා දැනට ඉදිකර ඇති පැන්නුම පාලමක් බවට පත්කර ගැනීම.</u>**

මධ්‍යම අධිවේගී මාර්ගය බස්නාහිර පළාතෙන් වයඹ පළාතට පිවිසෙන මා ඔය කෙටේවත්ත මංකඩ අධිවේගී මාර්ගයේ මා ඔය පාලමට යටින් පිහිටි මා ඔය හරහා දැනට ඉදි කර ඇති පැන්නුම පාලමක් බවට පත් කර ගත හැකි නම් අලව්ව ප්‍රදේශයෙන් මීරිගම ප්‍රදේශයට පිවිසීමේදී විශාල වටිනාකමක් හිමිවෙන බවත් දැනට මීරිගම දෙසින් මා ඔය ලගටත් අලව්ව ඕබඩගෙදර දෙසින් මා ඔය ලඟට කාපට් කර තිබෙන අතර රජයේ නව පාලම් 500 ව්‍යාපෘතියට යෝජනා කර යැවීම සුදුසු බවටත් පසුගිය දා අධික වර්ෂාවත් සමඟ එම මා ඔ හරහා ඉදි කර ඇති පැන්නුම මීරිගම දෙසින් මා ඔය ඉවුර ඛාදනය වී විනාශ වී ඇති අතර දැන් එය පිළිසකර වෙමින් පවතින නමුත් පාලමක් ඉදි කරන්නේ නම් ඉතා ප්‍රයෝජනවත් වන නිසා ඒ සඳහා පක්ෂ විපක්ෂ සියළු දෙනාගේ අවධානය යොමු කරවන ලෙස ඉල්ලීමක් කරමින් මාධ්‍යවේදී ජයන්ත දිසානායක මහතා විසින් ගරු විපක්ෂනායකතුමා වෙත යොමු කර ඇති ලිපිය මහා සභාවට ඉදිරිපත්කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ප්‍රදේශයේ උපන් මාධ්‍යවේදියෙක් ලෙස එතුමා මෙසේ යෝජනා කර තිබෙන්නේ මෙම ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමයි. මෙම පැන්නුම හරහා දඹදෙණි ආසනයත් මීරිගම ආසනයත් සම්බන්ධ වෙනවා. නමුත් අධික වැසි සහිත කාල වලට මෙම පැන්නුම හරහා ගමන් කල නොහැකියි. එම නිසා පාලම් 500 ව්‍යාපෘතිය සඳහා මෙය යෝජනා කර යැවීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. නමුත් තවත් කාරණයක් පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කල යුතුයි. එනම් පාරිභෝගික ජනතාව අපේ ප්‍රදේශයෙන් මීරිගම ප්‍රදේශයට යාමට පුරුදු වුවහොත් අපේ සභා බලප්‍රදේශයේ ගැවසෙන මුදල් වෙනත් බල ප්‍රදේශයකට ගලා යාමක් සිදු වෙනවා. ඒ තුලින් පහර වදින්නේ සභාවේ බදු ආදායම් මුදලටයි. එම නිසා මෙය ප්‍රායෝගික ගැටළුවක්.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ දිස්ත්‍රික් නායක, මහාමාර්ග අමාත්‍ය, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා පසුගිය කාලයේ පාලම්, බෝක්කු විශාල ප්‍රමාණයක් ඉදි කලා. එමෙන්ම මේ වන විට මාර්ග ගණනාවක් සංවර්ධනය වී තිබෙනවා. ඒ පිළිබඳව එතුමාට ස්තූතිවන්ත විය යුතුයි. මෙම පාලම ඉදි කිරීමේ යෝජනාවත් අත්‍යාවශ්‍ය යෝජනාවක් ලෙස යෝජනා කර යවමු. එමෙන්ම ජයතිලක මන්ත්‍රීතුමා පවසන දෙයෙහිත් සත්‍යක් තිබෙනවා. ඒ පිළිබඳවත් සලකා බලා අපේ අනන්‍යතාවය රැකෙන ලෙස එම කටයුත්තට සහාය දෙමු.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙය ඉතා වැදගත් යෝජනාවක්. එය අපි ඉහළට ඉදිරිපත් කරමු.

**<u>03.8 වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීම සම්බන්ධවයි.</u>**

රජයේ අත්‍යාවශ්‍ය වැඩපිළිවෙලක් වන කාබනික පොහොර නිශ්පාදන ක්‍රියාවලියට අදාලව වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීමට 2021.10.14 දින අදාල ලියකියවිලි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ලබා දුන්න ද දැනට මාස 04 ක් ඉක්ම ගොස් ඇතත් එම වාර්තාව හෝ ස්ථාන පරීක්ෂණයකට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් පැමිණ නැති බවත් අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා

ගැනීම සඳහා මෙම වෙළඳ බලපත්‍රය අත්‍යාවශ්‍ය වන බවත් කඩිනමින් මෙම බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීමක් කරමින් මඩවල, කැප්පිටිවලාන ලිපිනයේ පදිංචි ආර්.ආර්.පී.කේ.එස්. බණ්ඩාර මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජනතා නියෝජිතයෙක්ට මෙසේ නම් සාමාන්‍ය ජනතාවට කෙසේ ද යන්න සිතා ගත හැකියි. රජයේ අත්‍යාවශ්‍ය වැඩපිළිවෙලක් ලෙස කාබනික පොහොර නිශ්පාදන ක්‍රියාවලියට සහාය දීමක් මේ තුලින් සිදු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, දින 14 ක් තුල අදාල වාර්තා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් විසින් ලබා නොදෙන්නේ නම් එම වාර්තාව නොසලකා හැර වෙළඳ බලපත්‍රය ලබා දීමට මෙම සභාවේදී තීන්දුවක් ගෙන එය සම්මත කර තිබෙනවා. ඒ අනුව කටයුතු කිරීම සුදුසු වෙනවා.

**<u>03.9 කඩ කාමර වලින් ඉවත්කිරීමට උත්සාහ කිරීම.</u>**

අලව්ව නගරයේ මහ වීදියේ අංක 63, 61, 69 1/1, 69 4/1, 69 5/1, 65, 67 යන කඩකාමර සඳහා මාස්පතා නොකඩවා කඩකුලිය ගෙවමින් ව්‍යාපාරික කටයුතු කරගෙන යන අතර මහා මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම මත ව්‍යාපාරික ස්ථානවල ඉදිරිපස කොටස් කඩා දැමීමට සහයෝගය දී ඉතිරි කොටසේ ව්‍යාපාරික කටයුතු කරගෙන යන බවත්, කඩ කාමර වල කොටස් කඩා දැමුව ද මෙතෙක් ගෙවාගෙන ආ කුලී මුදලම වෙනස් නොකර පෙර පරිදි ම ගෙවාගෙන යන බවත් මහා මාර්ගය පුළුල් කිරීමේ කටයුත්තෙන් ප්‍රයෝජනය ගෙන මෙම කඩකාමර අයිතිකරු වන එම්.එස්. මාපා ගුණරත්න මහතා කඩකාමර වලින් ඉවත් කිරීම සඳහා මෙම කඩකාමර කඩා දමා එක් ගොඩනැගිල්ලක් අළුතින් ඉදි කිරීමට ප්‍රාදේශීය සභාවෙන් සැලැස්මක් අනුමත කර ගැනීමට භාර දී ඇති බව ඔහුගෙන් දැනගැනීමට ලැබුණු බවත් මෙම කඩකාමර වල ඉතිරිව ඇති කොටස් හොඳ තත්වයෙන් පවතින අතර අනතුරුදායක තත්වයක් නැති බවත් මේවා කඩා දමා අළුතින් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සැලැස්ම ප්‍රාදේශීය සභාවෙන් අනුමත කලහොත් කඩකාමර වලින් ඉවත් වීමට සිදු වන බැවින් මහත් පීඩනයට පත් ව ඇති බවත් එබැවින් මෙම කරුණු පිළිබඳව අවධානය යොමු කර ඉදිරිපත් කර ඇති ගොඩනැගිලි සැලැස්ම අනුමත නොකරන ලෙස ඉල්ලීමක් කරමින් අදාල කඩකාමර වල ව්‍යාපාරික මහතුන් විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙම කාරණයේදී කිසිවෙකුටත් අසාධාරණයක් නොවන ආකාරයට තීරණයක් ගන්නා බවයි මම මෙම ව්‍යාපාරිකයින්ට පවසා සිටියේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ගොඩනැගිල්ල අබලන් ගොඩනැගිල්ලක් බව සඳහන් කර ඉවත් කර ගැනීමට සභාවෙන් අවසරය ලබා දී තිබෙනවාද?

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කරන ලෙස දන්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් සභාවට ලිපියක් එවා තිබුනා. එය අපි ගොඩනැගිල්ලේ හිමිකරුට දැනුම් දුන්නා. ඊට එහා කටයුත්තක් අපි විසින් සිදු කලේ නැහැ. මෙහිදී අපිට කාගෙවත් පැත්තක් ගත නොහැකියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ආර්ථික අපහසුකම් කොතරම් තිබුණත් වෙළඳ ප්‍රජාව විසින් තමන්ගේ කඩයේ ඉදිරිපස කොටස කඩලා අපිට සහයෝගය ලබා දුන්නා. මෙම ගොඩනැගිල්ල කැඩීමට තරම් අවශ්‍යතාවයක් නැහැ. අපි මෙම ගොඩනැගිලි සැලැස්මට අනුමැතිය ලබා දුනහොත් බස් නැවතුම්පල මාර්ගයේත් මෙම ගැටළුව ඒවි. එවිට අපිට වෙළඳ ප්‍රජාවගේ සහයෝගය ලබා ගත නොහැකියි. මාපා ගුණරත්න මහත්මා විසින් මේ සිදු කිරීමට යන්නේ ව්‍යාපාරිකයින් හතර දෙනා කඩවලින් එළියට දමන වැඩපිළිවෙලකුයි. අවබෝධතා ගිවිසුමක් අත්සන් කර අදාල කඩවල සිටින ව්‍යාපාරිකයින්ට එම කඩය දෙන බවට එකඟතාවයකට එනතුරු සභාවක් ලෙස අපිට මේ සඳහා අනුමැතිය ලබා දිය නොහැකියි. ගැටළුවක් තිබෙනවා නම් ඉඩම් හිමියාට සහ කඩ හිමියන්ට අධිකරණයට ගොස් අවශ්‍ය ප්‍රශ්න විසඳාගත හැකියි. අද අපි ගන්නා ක්‍රියාමාර්ගයේ යම් කිසි වැරැද්දක් සිදු වුවහොත් වෙළඳ සංගම් ඇතුළු සියල්ල අපිට විරුද්ධව කටයුතු කරනවා. අපේ ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් යම් කිසි ගෞරවයක් අපි තුල තිබිය යුතුයි. ඉදිරි කටයුතු කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමු කර ව්‍යාපාරිකයින්ට ගැටළුවක් නොවන ආකාරයට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම මේ සඳහා සභාවේ අවසරය ලබා නොදෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉඩම් හිමියාත් කඩ හිමියනුත් ගෙන්වා මේ පිළිබඳව අවබෝධයක් තිබෙන පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුත් කැදවා සාකච්ඡා කර මෙම ප්‍රශ්නය විසඳමු. මොවුන් නීතිමය පැත්තට ගොස් අපි තුලින් මෙය විසඳා ගැනීමට ගියහොත් අපිට එය ලොකු ගැටළුවක් වෙනවා. මාස්පතා බදු මුදල් ගෙවන මෙම ව්‍යාපාරිකයින් අපි විසින් ආරක්ෂා කරගත යුතුයි. මාපා ගුණරත්න මහතාගේ අවශ්‍යතාවය ඉටු කර ගැනීමට අවස්ථාව ලබා දිය යුත්තේ ව්‍යාපාරිකයින්ට මූලිකත්වය ලබා දීලයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙතන ලොකු වැරැද්දක් වෙලා තිබෙනවා. අපේ සභාව නොමඟ යවා තිබෙනවා. අපි බලය දෙන්නේ නැතුව බලය දුන් බව වෙළඳ ප්‍රජාවට කියා තිබෙනවා. ඒ පිළිබඳව ඔහුව දැනුවත් කර ඔහුට අවවාදයක් කල යුතුයි. නැතිනම් එය පූර්වාදර්ශයක් වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

නගරය සංවර්ධනය කිරීමේදී සභාවේ වගකීම වූයේ අනෙක් අය දෙන නියෝග පිළිපැදීම පමණයි. නගර සංවර්ධනයට මුදල් වෙන් කර තිබෙන්නේ නගර සංවර්ධන අධිකාරියෙනුයි. මෙම සංවර්ධන කටයුත්ත නගරයේ මැදින් නැවතෙන බව ප්‍රකාශ කල විට මම සභාපති ධූරයට පැමිණියායින් පසුව මෙම සංවර්ධනය ඉදිරියට රැගෙන යා යුතු බව ප්‍රකාශ කලා. ඉන් පසුව එම කොටසට ප්‍රතිපාදන වෙන්කර තිබෙනවා. මේ වන විට මෙම සංවර්ධන කටයුතු සඳහා නගර සංවර්ධන අධිකාරියෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මින් ඉදිරියට මෙම සංවර්ධනයේ නියමුවා විය යුත්තේ ප්‍රාදේශීය සභාවයි. මොකද මේ එන සෑම ප්‍රශ්නයකටම උත්තර දිය යුත්තේ ප්‍රාදේශීය සභාව විසිනුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, නගරය සංවර්ධනය කරන වැඩකටයුතු වලදී සභාව නායකත්වය ගත යුතුයි. නැතහොත් අලව්ව පිළිබඳව නොදන්නා පිරිසක් පැමිණ සැලසුම් හදනවා. තවත් නිලධාරීන් පිරිසක් පැමිණ කටයුතු කරනවා. පසුව අලව්ව නගරයේ මෙම සභාවත් සමඟ සිටින වපාරික මහත්වරු ටිකටත් අසාධාරණයක් සිදු වෙනවා. අවසානයේ ප්‍රශ්නයක් පැමිණි විට එයට මැදිහත්විය යුත්තේ සභාවයි. නමුත් මෙම සංවර්ධන කටයුතු සිදු කෙරෙන විට සභාවෙන් නායකත්වය ගතහොත් එම ප්‍රශ්න ඇතිවන්නේ නෑ. ඒ සඳහා ඔබතුමිය නායකත්වය ගන්න. අපි

සියළු දෙනා ඔබතුමියට සහයෝගය ලබා දෙනවා. ඉඩම් හිමියාට වඩා සභාවට සමීපව කටයුතු කරන ව්‍යාපාරික ප්‍රජාව අපි පළමුවෙන්ම ආරක්ෂා කල යතු යැයි විශ්වාස කරනවා. ඒ අනුව මෙම දෙගොල්ලන් කැඳවා සාකච්ඡා මාර්ගයෙන් අවබෝධතා ගිවිසුමක් මත කටයුතු කිරීමට මැදිහත් වෙමු යැයි යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව නගරයට මෙම සංවර්ධනය ගෙන ආවේ කාලයක් තිස්සේ පෙරුම් පුරලයි. එය ක්‍රියාත්මක කිරීමේදී භූමියේ අයිතිකරුවන්ට වඩා වෙළඳ ප්‍රජාව දායකත්වය ලබාදුන්නා. අද මෙම ගැටළුවේදී මෙම ව්‍යාපාරිකයින් එළියට දැමීමට විරුද්ධ නොවුනහොත් ඉදිරියට ව්‍යාපාරිකයින්ගේ සහයෝගය ලබා ගැනීමේ හැකියාව නැති වී යනවා. සභාව කෙරෙහි ඔවුන්ට තිබෙන විශ්වාසයත්, ගරුත්වයත් පළුදු නොවෙන ආකාරයට කටයුතු කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ව්‍යාපාරික මහතුන් දීර්ඝ කාලයක් තිස්සේ මෙම කඩවල තම ව්‍යාපාර කරගෙන ඇවිල්ලා තිබෙනවා. එදා අතීතයේ තිබුණු වානිජ වටිනාකමට වඩා අද වන විට මෙම කඩකාමර වල වානිජ වටිනාකම ඉතා ඉහළ ගොස් තිබෙනවා. එවිට කඩහිමියාටත් මෙම ගොඩනැගිලි පිළිබඳව පුංචි තණ්හාවක් ඇති වෙනවා. මෙතෙක් කල් මෙම කඩවල ව්‍යාපාරික මහතුන් සභාවට ලැබිය යුතු බදු සියල්ල ගෙව්වා. සභාවක් ලෙස නගරය තුල යම් වැඩසටහනක් ක්‍රියාත්මක කලා නම් ඒවාට සහායෝගය ලබා දුන්නා. මෙම ගොඩනැගිල්ලට අපි නිසි ක්‍රියාමාර්ග නොගතහොත් ඊලඟ ගොඩනැගිල්ලේ හිමිකරුත් මෙසේම ක්‍රියාකල හැකියි. එම නිසා මෙම පළමු අවස්ථාවේදීම මේ සඳහා නිසි විසඳුමක් ලබා දිය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ප්‍රශ්නයේදී  අපි මධ්‍යස්ථ තැනක සිට ක්‍රියාකල යුතුයි. වෙළඳ ව්‍යාපාරිකයින් අපිට සහාය ලබා නොදුන්නා නම් විශාල ගැටළු වලට මුහුණ දීමට සිදු වෙනවා. එම නිසා ඔවුන් ආරක්ෂා කිරීමේ වගකීමක් අපිට තිබෙනවා. මෙහිදී අපි වැරදි පූර්වාදර්ශයක් ගතහොත් ඊලඟට නගරයේ සංවර්ධන කටයුත්තක් කරන විට අපිට ව්‍යාපාරිකයින්ගේ සහයෝගය නොලැබී යනවා. එවිට අපි ප්‍රාදේශීය සභාවක් ලෙස හුදෙකලා වෙනවා. එයින් අත්මිදීමට අපි මෙහිදී පැහැදිලි තීන්දුවක් ගත යුතුයි. නීතිමය තත්වය සලකා බලා අපිට සහාය දුන් ව්‍යාපාරිකයින් ආරක්ෂා කල යුතුයි. ඉදිරි සංවර්ධන කාර්යයන් වලදී සියළුදෙනාගේ සහයෝගය ලැබෙන ආකාරයට කටයුතු කල යුතුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ඔබතුමන්ලා පල කල අදහස් අනුව අපි ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමු.

**04.** <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>

**05.** <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>

**(05-1)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/47 - 01 දරණ යෝජනාව</u>

දෛනික පදනම මත අප සභාවේ සේවය කරන ඒ.ඒ.එස්.ඕ.එම්. අලහකෝන් යන අයගේ ගිවිසුම් කාලය 2022.04.06 දිනෙන් අවසන් වන අතර ඔහුගේ සේවය තවදුරටත් සභාවට අත්‍යාවශ්‍ය වන බැවින් සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත අයගේ සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-2)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/47 - 02 දරණ යෝජනාව</u>

වැලිහිඳ, කැප්පිටිවලාන ලිපිනයේ පදිංචි ඩබ්.ඒ. දමයන්ති මැණිකේ මහත්මිය හට වරිපණම් අංක 196, 194, 192 නමින් වරිපණම් අංක 03 කින් තක්සේරු දැන්වීම් ලැබී ඇති බවත් 192 හි සඳහන් ස්ථානයේ තහඩු සෙවිලි කල වෙළඳසැලක් මේ වන විට නොමැති අතර එය කඩා ඉවත් කර ඇති බැවින් ඒ සඳහා වරිපණම් ගෙවීමෙන් නිදහස් කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඉතිරි අංක 02 සඳහා වරිපණම් ගාස්තු ගෙවා ඇති බවත් දන්වා තිබෙනවා. මෙම ඉල්ලීමට අනුව ආදායම් පරීක්ෂකතුමා විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඇති අතර තහඩු සෙවිලි කල කඩය එම ස්ථානයේ නොමැති බව පෙනී ගිය බවත් එම දේපළට අදාල වරිපණම් මුදල නිදහස් කිරීම සුදුසු බවත් වාර්තා කර තිබෙනවා. ඒ අනුව අංක 192 ට අදාල වරිපණම් මුදලින් නිදහස් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව වැලිහිඳ, කැප්පිටිවලාන ලිපිනයේ පදිංචි ඩබ්.ඒ. දමයන්ති මැණිකේ මහත්මිය අංක 192 ට අදාල වරිපණම් මුදලින් නිදහස් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/47 - 03 දරණ යෝජනාව</u>

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ පූර්ණ අනුමැතිය අනුව 2007 වසරේ ඇරඹි ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය පළාත් පාලන ආයතන නියෝජනය කරනු ලබන ජාතික මට්ටමේ සම්මේලනයකි. එය පළාත් පාලන ආයතන සතු වන අතර සංසදයේ පැවැත්ම රඳා පවතින්නේ පළාත් පාලන ආයතන වල දායකත්වය මත බව එම සංසදය විසින් දන්වා ඇත. ඒ අනුව 2022 වසර සඳහා ද විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට මෙම සංසදය අපේක්ෂා කරන බවත් 2022 වසර සඳහා ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ සාමාජිකත්වය ලබා ගන්නා ලෙසත් එම සංසදය විසින් දන්වා ඇති අතර ඒ අනුව වාර්ෂික සාමාජික මුදල වන රු. 15,000.00 ක මුදලක් ගෙවා ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ සාමාජිකත්වය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව වාර්ෂික සාමාජික මුදල වන රු. 15,000.00 ක මුදලක් ගෙවා ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ සාමාජිකත්වය ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-4)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා විසින් කරනු ලබන අංක 06/47 - 04 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ නව සභාපතිනිය වශයෙන් දිවුරුම් දී වැඩ භාරගෙන කටයුතු කරන ගරු පද්මා වැත්තැව මැතිනියට මෙම සභාවේ පූර්ණ විශ්වාසය පළ කල යුතු බවට යෝජනා කරන අතර එම අවස්ථාව සලසා දුන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, කුරුණෑගල දිස්ත්‍රික් නායක ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමාටත් මෙම සභාවේ ගෞරවාදර ස්තූතිය පුද කල යුතු බවට යෝජනා කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, කුරුණෑගල දිස්ත්‍රික් නායක ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා යන මැතිතුමන්ලාගේ ආශිර්වාදය ඇතිව ඔබතුමිය මෙම සභාපති ධූරයට පත් වූවා. පැවති යම් යම් අර්බුද සමථයකට පත් වී දැන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ලෙස අපි එක තීරණයක සිටිනවා. මේ සභාවේ කටයුතු ඉතාම හොඳින් ඉදිරියට ගෙන යන බවට ඔබතුමිය පිළිබඳ අපිට පූර්ණ විශ්වාසයක් තිබෙනවා. අලව් පුරවරයේ දියුණුවට එදා ඔබතුමියගේ පියාණන් වන ගරු පී.බී. වැත්තැව මැතිතුමා විසින් කල දැවැන්ත සංවර්ධනයට නොදෙවෙනි සංවර්ධනයක් ඔබතුමියට ඉටු කිරීමට හැකි වේ යැයි අපිට විශ්වාසයක් තිබෙනවා. ඔබතුමිය රාජ්‍ය දේපළ අනවශ්‍ය ලෙස පාවිච්චි කරන්නේ නැහැ. අනවශ්‍ය හිස් වචන භාවිතා කරන්නේ නැහැ. ඔබතුමිය කටයුතු කරන්නේ අපි සියළු දෙනාටම ආදර්ශයක් වන ආකාරයටයි. ඒ අනුව ඔබතුමිය විසින් දරණු ලබන මෙම සභාපති ධූරයට සහ ඔබතුමියගේ ගමනට අපගේ සම්පූර්ණ විශ්වාසය පළ කරන අතර එයට අපගේ සහයෝගය ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වීරවංශ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන්නේ ඉතාම කාලෝචිත යෝජනාවක්. මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට හේතු වන්නට ඇත්තේ පසුගිය දිනක සිදු වූ අවාසනාවන්ත සිදුවීම තේමා කරගෙන එය සමථයකට පත් කරගෙන ඉදිරි වර්ෂය සැලසුම් කර තිබෙන ආකාරයට අපේ ප්‍රදේශයේ ජනතාවට තිරසාර සේවයක් උදා කර දීමට වාතාවරණය සැලැස්වීමට විය යුතුයි. මෙය ඔබතුමිය දෙවන වරට සභාපති ධූරයට පත් වූ අවස්ථාවයි. පළමු වරට අපි ආධුනික මන්ත්‍රීවරුන් ලෙස එක්සත් ජාතික පක්ෂයෙනුත්, ඔබතුමිය පොදුජන එක්සත් පෙරමුණෙන් නවක මන්ත්‍රීවරියක් ලෙසත් 1998 මැතිවරණයට ඉදිරිපත් වුනා. නවක මන්ත්‍රීවරියක් වුවත් මනාප 1483 ක් ලබා ගෙන වාර්තාගත ජයග්‍රහණයක් අත් කර ගෙන සභාපති ධූරයට පත් වුනා. ඒ අවස්ථාවේදී එම සභාවේ සිටි කිහිපදෙනෙකුගේ අවශ්‍යතාවයට ඔබතුමිය අපහසුතාවයට පත් කර සභාපති ධූරය එපා කරවීමට කටයුතු සිදු වුනත් ඔබතුමිය ඒවායින් සැලුනේ නැහැ. හොඳ මානසික සුවයෙන් ඒ සියල්ල විඳ දරාගෙන සභාපති පුටුවේ ගෞරවය ආරක්ෂා කලා. එදා නවක මන්ත්‍රීවරයෙක් ලෙස මගේ පළමු යෝජනාව වූයේ ජලය නොමැතිව තිබුණු බෝයවාලන පුස්තකාලය, බෝයවලාන පොදු වෙලඳපළ සහ වැසිකිළි පද්ධතියට ජලය ලබා ගැනීමයි. ඒ සඳහා පළාත් සභාවේ නිමල් බණ්ඩාර මහ ඇමතිතුමාගේ අවධානය යොමු කල විට රු. ලක්ෂ 05 ක මුදලක් ප්‍රාදේශීය සභාවට නිදහස් කලා. ඒ අනුව ළිඳ බැඳලා, ටැංකිය හදලා ජලය ලබාදීමට ඔබතුමිය කටයුතු කලා. මේ ආකාරයට තම පක්ෂයෙන් කුමන අභියෝග පැමිණියත් කල යුත්ත තේරුම් ගෙන සෑම මන්ත්‍රීවරයෙක්ටම ප්‍රතිපාදන වෙන් කර ලබා දුන්නා. එමෙන්ම අලව්ව මහජන පුස්තකාලය සහ ආයුර්වේදය තිබෙන ගොඩනැගිල්ල සහ එම ඉඩම සභාවට ලබා ගැනීමට ඔබතුමිය කටයුතු කලා. මෙවර මැතිවරණ සමයේදී සභාපති ධූරයට පත් වන බවට ජනතාවගේ බලාපොරොත්තුව වූයේ ඔබතුමිය වුවත් සන්ධ්‍යා කුමාර මැතිතුමා

සභාපති ධූරයට පත් වුනා. නමුත් ඔබතුමිය කිසිදු විටක එතුමාව අපහසුතාවයට පත් කලේ නැහැ. පසුව එතුමාගේ අභාවයෙන් පසු ඔබතුමිය සභාපති ධූරයට පත් වුනා. මේ වන විට අයවැය ජයග්‍රහනය කර පැවති අර්බුද සමථයකට පත් වී පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලැබී තිබෙනවා. ඒ අනුව ඉදිරි කාලය තුල යහපත් සේවාවක් කිරීමට තෝතැන්න සකස් වී තිබෙනවා. දේශපාලනයේදී ඉවසීම ඉතාම අත්‍යාවශ්‍ය දෙයක්. ඔබතුමිය සභාපති ධූරයට පත් වූ අවස්ථා දෙකේදීම ඔබතුමියගේ චරිතය තුලින් අපි එය දුටුවා. තනතුර නිසා මිනිසා නොව මිනිසා නිසා තනතුර බැබලිය යුතුයි යන උදාර කියමන සනාථ කිරීමට හොඳ අවස්ථාවක් ඔබතුමියට ලැබී තිබෙනවා. ඒ සඳහා ඔබතුමිය පිළිබඳ අපගේ පූර්ණ විශ්වාසය පවතින බව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, ඔබතුමිය සභාපති ධූරයේ සිටීම පිළිබඳව කාන්තාවන් ලෙස අපි ඉතා සතුටට පත් වෙනවා. මම ඔබතුමිය පිළිබඳව දන්නේ පුංචි කාලයේ සිටයි. රාජකාරී කරන කාලය තුලත් නිහතමානීව රාජකාරිය කල අයෙක් බව අසා තිබෙනවා. ඒ අනුව ඔබතුමිය මෙම සභාපති ධූරයට ගැලපෙන බව අපි තේරුම් ගත්තා. මෙම ටික කාලය තුල අපි සියළු දෙනා පිළිබඳ මනා වැටහීමකින් කටයුතු කල බව අපිට පෙනුනා. මෙම වසරේ බල ප්‍රදේශයට ඉතා වටිනා කාර්ය භාරයක් ඉටු කිරීමට ඔබතුමියට ශක්තිය ලැබේවායි කාන්තාවන් ලෙස අපි සියළු දෙනාගේ ආශිර්වාදය පලකරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සන්ධ්‍යා කුමාර මැතිතුමාගේ අභාවයෙන් පසුව අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය සඳහා ඔබතුමිය පත් වීම පිළිබඳව ආණ්ඩු පක්ෂයක් ලෙස අපේ විරුද්ධත්වයක් පැවතියේ නැහැ. පුද්ගලිකව මගේ විරුද්ධතාවයක් පැවතියෙත් නැහැ. මම මෙම මන්ත්‍රී ධූරයට නවකයෙක් වුවත් පක්ෂයට නවකයෙක් නොවෙයි. මගේ පියා සහ සහෝදරයා සමඟ දිවංගත ගරු පී.බී. වැත්තැව මැතිතුමා දේශපාලනය කර තිබෙනවා. ඔබතුමිය සහ අපි එක පක්ෂයක එක නායකයෙක් යටතේ එකම නායකයෙකුගේ ආශිර්වාදයෙන් ආණ්ඩු පක්ෂයක් ලෙස අලව්ව ප්‍රාදේශීය සභාවේ බලයට පත් වුනා. යම් යම් මතිමතාන්තර ගැටුම් ඇති වුන නමුත් දේශපාලනයේ හැමදාම මිතුරෝත් හැමදාම සතුරෝත් නැහැ. එම මත භේද සියල්ල සමනය කර අද අපි එක මවකගේ දරුවන් මෙන් අපි 18 දෙනා එක කණ්ඩායමක් ලෙස ඉදිරියට යාමට තීරණය කර තිබෙනවා. ඔබතුමිය ශ්‍රේෂ්ඨ නායිකාවක්. ඔබතුමිය පිළිබඳව මම කුඩා කල සිටම දන්නවා. අපි එක කණ්ඩායමක් ලෙස අලව් පුරවරයේ ජනතාවගේ බලාපොරොත්තු මුදුන්පත් කිරීම සඳහා කටයුතු කිරීමට අපගේ සහයෝගය ඔබතුමියට උපරිමයෙන් ලබා දෙන බව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි යන එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායක මැතිතුමාගේ උදාරතර චින්තනය අනුව යමින් දඹදෙණිය මැතිවරණ කොට්ඨාශයේ වාමාංශික නායකයින් අතර මහජන මන්ත්‍රී පී.බී. වැත්තැව මැතිතුමා ඉතා ශ්‍රේෂ්ඨ සේවයක් බල ප්‍රදේශයට ඉටු කලා. පසුව අපිට ඔබතුමියව දේශපාලනයේදී දැන හඳුනා ගැනීමට හැකි වුනා. ඔබතුමිය අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිනිය වශයෙන් පළමු වර පත් වුනා. පසුව වයඹ පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරියක් ලෙසත් දඹදෙණිය මැතිවරණ කොට්ඨාශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරිය ලෙසත් ගිය ගමන් මගෙහි අපි ඔබතුමියව දැන හඳුනා ගත්තා. දැන් ඔබතුමිය වත්මන් සභාපතිනිය වශයෙන් පත් වී සිටිනවා. ගියවර පැවති සභාවක දී අප ක්‍රියා කලේ පෞද්ගලිකව ඔබතුමියට පැවති විරුද්ධත්වයක් නිසා නොවෙයි. මා නියෝජනය කරන්නේ මෙම කොට්ඨාශ 15 තිබෙන දරුණු ම කොට්ඨාශයයි. එනම් වැත්තැව කොට්ඨාශයයි. එම කොට්ඨාශයට වැඩි අවධානයක් යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. අපගේ පූර්ණ විශ්වාසය ඔබතුමිය වෙනුවෙන් ප්‍රකාශ කර සිටින අතර බල ප්‍රදේශයේ ජනතාවගේ සියළු සිතුම් පැතුම් ඉටු කිරීමට මෙම ජනතා මණ්ඩපයේ නායිකාව ලෙස ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔබතුමියට සුබපතනවා. එමෙන්ම අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සහ අපේ විපක්ෂයේ සියළු මන්ත්‍රීවරුන් සතුටු වන ආකාරයට ඔබතුමිය ඉදිරියටත් කටයුතු කරාවි යැයි බලාපොරොත්තු වෙනවා. අපේ හිටපු සභාපතිතුමාත් බල ප්‍රදේශයට විශාල සේවයක් කලා. සතයක් වත් වංචා කලේ නෑ. එය අගය කල යුතුයි. එමෙන්ම දිවංගත ගරු පී.බී. වැත්තෑව මැතිතුමාත් ඉතාම පිරිසිදු පුද්ගලයෙක්. ඔබතුමියත් ඉතාමත් ගෞරවාන්විතව කටයුතු කරන සභාපතිතුමියක්. මවක් මෙන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියළු මන්ත්‍රීවරුන්ට එක වගේ සලකාවි යැයි අපි සිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, දිවංගත ගරු පී.බී වැත්තෑව මැතිතුමා බල ප්‍රදේශයට මහඟු මෙහෙවරක් කල ගෞරවනීය දේශපාලන චරිතයක්. එතුමාගේ දියණිය ලෙස පද්මා වැත්තෑව මැතිණියට මා තුල තිබුණේ විශාල ගෞරවයක්. දේශපාලන භූමිකාව තුල යම් යම් ගැටළු සහගත තත්වයන් ඇති වුනත් අපේ ආණ්ඩු පක්ෂයේ සියළු මන්ත්‍රීවරුන්ගේ පූර්ණ විශ්වාසය පුද කරමින් ඉදිරියේදී සභාවේ සියළු කටයුතු සාර්ථක කර ගැනීමට ආණ්ඩු පක්ෂයේ සියළු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලැබේවි යැයි මම විශ්වාස කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි පුංචි කාලයේ සිටම ගරු පී.බී. වැත්තෑව මැතිතුමා අපේ පවුල් සමඟ සබඳකම් පැවැත්වූවා. අපි කණ්ඩායමක් ලෙස ආණ්ඩු පක්ෂය තුල සිටිනවා. පසුගිය දිනක මෙම සභාවේදී යම් කිසි සිදුවීමක් සිදුවුනා. කෙසේ වෙතත් මේ වන විට අපි සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ තිබෙනවා. ප්‍රාදේශීය සභාව හරහා යම් සංවර්ධනයක් කෙරෙනවා ද එහිදී අපි අපේ උපරිම සහයෝගය ලබා දෙනවා. ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙසත්, උප සභාපති ලෙසත් අනෙකුත් මන්ත්‍රීවරු සමඟ මෙම සභාව ක්‍රමවත්ව ඉදිරියට ගෙන යාමේ වගකීමක් තිබෙනවා. එහිදී පැන නගින ගැටළු තාවකාලිකව අමතක කර ඉදිරියට යා යුතුයි. උප සභාපතිවරයා ලෙස මාගේ සහයෝගය ඔබතුමියට ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම යෝජනාව ඉදිරිපත් කල චමින්ද වීරවංශ මන්ත්‍රීතුමාට මගේ ස්තූතිය පුදකරනවා. එදා මේ සභාවේදී යම් සිද්ධියක් සිදු වුනා. මෙම යෝජනාව තුලින් එම මතභේදාත්මක තත්වය නවත්වා ගැනීමට හැකියාව ලැබෙයි. පසුගිය කාලයේ විවිධ දේ නිවැරදි කර ගැනීමට අපි උත්සාහ කලා. නමුත් එම උත්සාහයන් අසාර්ථක වූ නිසා යම් යම් තීන්දු තීරණ ගැනීමට සිදු වුනා. නමුත් වර්තමාන සභාපතිතුමිය පත් වී ගත වූ සුළු කාලය තුල එතුමියගෙන් කිසිම අයෙකුට අගතියක් සිදු වන බවක් පෙනෙන්නේ නැහැ. අද පත් වී සිටින්නේ සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ට එක හා සමානව සලකන සභාපතිවරියක්. දිවංගත ගරු පී.බී. වැත්තෑව මැතිතුමා ප්‍රදේශයට විශාල සේවාවක් කරමින් ප්‍රදේශයේ ඉඩම් අහිමි ජනතාවට ඉඩම් හිමි කර දුන් නායකයෙක්. එතුමාගෙන් ලැබුණු ආභාෂයෙන් මේ ප්‍රදේශයට විශාල සේවාවක් කරන නායිකාවක් ලෙස පොදු ජනතාව අතර ඔබතුමිය ප්‍රචලිතයි. ජනතා නියෝජිතයින් වශයෙන් ජනතාවගේ බලාපොරොත්තුව අපේත් බලාපොරොත්තුවයි. මේ වන විට මන්ත්‍රීවරු සියළු දෙනා එකතු වී හොඳ ගමනක් යාමට මෙම බලප්‍රදේශය සංවර්ධනය කිරීමට කැපවෙලා තිබෙනවා. ඒ අනුව ඔබතුමියට අපි සියළු දෙනාගේම විශ්වාසය පළ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මුලින්ම ඔබතුමියට සුභාසිංශනය කරනවා. අපි පසුගිය මහා සභාවකදී ඔබතුමියට විරුද්ධව යම් අරගලයක් කලා. එහිදී ඔබතුමියගේ පෞද්ගලික චරිතය නොව අපිට

වැදගත්වූයේ මෙම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමිය යන භූමිකාවයි. එහිදී අපේ යම් යම් අඩුපාඩුකම් ඇතිවුනා. ආණ්ඩු පක්ෂයේ නායිකාව වශයෙන් ඔබතුමිය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සමඟ රැස්වීමක් හෝ හමුවක් නොගත් නිසයි ගැටළු ඇතිවුනේ. නමුත් අපි එක්වී සාකච්ඡා කර එක ගමනක් යාමට දැන් තීරණයක් ගෙන තිබෙනවා. මෙම බලප්‍රදේශයේ ජනතාවගේ සිතුම් පැතුම් ඉටු කර හොඳ සේවාවක් කිරීමට ඔබතුමියට හැකි බවට අපි තුල විශ්වාසයක් තිබෙනවා. ඒ සඳහා ඔබතුමියට අපගේ සහයෝගය ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාව ඉතාම ගෞරවණීය ප්‍රාදේශීය සභාවක්. එම ගෞරවණීය භාවයට යම් කිසි කැලලක් එක් වුණා. එය වෙනස් කරගෙන අපි සියළු දෙනාම සහෝදරත්වයෙන් මේ ගමන යාමට කටයුතු කරන බව පැවසීමට හොඳම අවස්ථාව මෙයයි. මම ඒ පිළිබඳව බොහෝ සතුටු වෙනවා. එදා සිද්ධියේදී මගේ හිත රිදුණු කාරණාවක් තිබෙනවා. කුමන පක්ෂයක කෙනෙක්වත් ගරු පී.බී. වැත්තෑව මැතිතුමාට දෝෂාරෝපණයක් කරනවා මා අසා නැහැ. නමුත් එදා සිදුවීමේදී එතුමාට යම් දෝෂාරෝපණයක් එල්ල කලා. අලව්ව රෝහල ඩිපෝව, සමූපකාරය , නිවාස ව්‍යාපෘති ආදී සෑම දේකදීම ගරු පී.බී. වැත්තෑව මැතිතුමා අමතක කල නොහැකියි. මෙම නගර ශාලා ගොඩනැගිල්ල පවා එතුමාගේ නිර්මාණයක්. දඹදෙණියේ වැත්තෑව මැතිතුමා යනු සුවිශේෂී නායකයෙක්. එතුමාට එල්ල කල චෝදනා සම්බන්ධව මම පෞද්ගලිකව කණගාටුවට පත් වුනා. දේශපාලනය කලින් කලට පරිවර්තනය වෙනවා. ඒවාට අපි අනුගත විය යුතුයි. අපි මුල සිටම ඔබතුමියට විශ්වාසය පලකර සිටියා. පත් වන සභාපති කවුරු වුවත් අපි ඔහු සමඟ කටයුතු කල යුතුයි. ඔබතුමිය පිළිබඳ විශ්වාසය පල කිරීමට හේතු කාරණා ගණනාවක් ම තිබෙනවා. ඔබතුමිය පළමුවර අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිධූරයට තේරී පත්වන්නේ වැඩිම මනාප ලබාගත් සභාපතිවරයා ලෙස වාර්තාවක් තබලයි. එම සභාව වංචාවෙන් දූෂණයෙන් තොරව ඔබතුමිය විසින් ගෙන ගිය බව අපි දුටුවා. ඉන් පසු පළාත් සභාවේ මන්ත්‍රීවරියක් ලෙස තේරී පත්වී පසුව මේ ආසනයේ සංවිධායකවරිය ලෙස පත් වුනා. එහිදී ඔබතුමියගෙන් වංචාව දූෂණය අපි දුටුවේ නෑ. එමෙන්ම රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමිය ලෙස ඔබතුමිය සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කලා. ඔබතුමියට ගුරුවරියක් ලෙස හොඳ විනයක් තිබෙන බවත් අපි දැනගෙන හිටියා. කිසි විටෙක බොරදියේ මාළු බෑමට අපි ක්‍රියාකලේ නෑ. සභාපති ධූරයට පත්වන විටම ඔබතුමිය හොඳ ද නරක ද යන්න අපිට තීරණය කල නොහැකියි. අර්බුදකාරී අවස්ථාවක් උද්ගත වූ මොහොතක නවකයන් හට නිවැරදි මග පෙන්වීම ජ්‍යෙෂ්ඨයන්ගේ වගකීමයි. ඔබතුමිය ධූරයට පත් වූ අවස්ථාවේදීම බලප්‍රදේශයට පැමැණි විශාල ව්‍යසන හමුවේ ඉතා කාර්යක්ෂම ව ක්‍රියා කලා. විය යුතු දේ ඉතා කඩිනමින් ක්‍රියාත්මක කලා. ආණ්ඩු පක්ෂයේ මෙන්ම සියළු මන්ත්‍රීවරු ආරක්ෂා කිරීමේ වගකීම සභාපතිතුමිය ලෙස තමාට තිබෙන බව ඔබතුමිය ගිය සභා වාරයේදී ප්‍රකාශ කලා. මේ සභාවේ පරිපාලනයත් ඉතාම නිවැරදි දිසාවකට ඔබතුමිය විසින් රැගෙන යන බව පෙනෙනවා. ඔබතුමිය මෙතෙක් අපේ විශ්වාසය බිඳ නැහැ. මතුවට බිඳින්නෙත් නැති බව විශ්වාසයි. එම නිසා ඔබතුමියට අපගේ සහයෝගය, ශක්තිය ලබා දෙනවා මෙන්ම ඔබතුමිය වෙනුවෙන් මෙම විශ්වාසය පලකරන යෝජනාවට අත් දෙකම ඔසවා සහයෝගය දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය දවසක මේ මහා සභාවේදී සිදු වූ සිද්ධිය අපිට අපහාසය උපහාසය මුසු නව අත්දැකීම් ප්‍රමාණයක් එක් කලා මිස දුක් වීමට කණගාටු වීමට කාරණාවක් ඇති වූයේ නෑ. ගරු සභාපතිතුමිය ගුරුවරියක්ව සිටියදී මම ඇයගෙන් ඉගෙනගත්තා. නමුත් පසුකාලීනව එතුමියගේ දේශපාලන මතයත් අපගේ දේශපාලනමතයත් දෙකක් බවට පත් වුනා. ළමා කැලක් හැසිරවූ ගුණ නැනින් යුතු දරුවන් බිහි කල අත්දැකීම් බහුල ගුරු මාතාවක් ලෙස ඔබතුමිය සභා ගර්භයේදී ඉතා ඉවසීමෙන් කටයුතු කලා. මෙම ගුණාංග ලැබීමටත් මෙම තනතුරු තානාන්තර ලැබීමටත් වාසනා ගුණයක් තිබිය යුතු වෙනවා. සන්ධ්‍යා කුමාර මැතිතුමාගේ අභාවයෙන් පසු

පක්ෂයේ නායකයන් විසින් මෙම තනතුරට ඔබතුමිය පත් කිරීම දේශපාලන වශයෙන් ගත් තීන්දුවක්. අනෙක් පැත්තෙන් ගතහොත් අත්දැකීම් බහුල කෙනෙකුට ලබා දුන් අවස්ථාවක් ලෙස මම දකිනවා. සභාපතිතුමිය ඇතුළු සභිකයින් සියළු දෙනා එක තැනකට එක් වී හොඳ අලව්ව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයක් නිර්මාණය කිරීමට අවශ්‍ය කරන එකඟතාවයට පැමිණ තිබෙනවා. ඒ අනුව ගරු සභාපතිතුමිය ඇතුළු මෙම සභාවට විශ්වාසය තහවුරු කරගෙන කටයුතු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය සභා වාරයකදී වූ සිදුවීමෙන් සභාවක් ලෙස අපි සියළු දෙනාම අපහසුතාවයට ලක් වුනා. අද වන විට දේශපාලකයින් කෙරෙහි ජනතාව සිටින්නේ ඉතාම වෛරයෙන්. මෙම අලව්ව ප්‍රාදේශීය සභාවේ එම සිද්ධිය ඇති වූයේ එවැනි කාල වකවානුවකයි. එය මාධ්‍ය වාර්තා කර තිබුනා. ඒ සඳහා පලකර තිබූ ජනතා ප්‍රතිචාර වලින් දේශපාලඥයින් ලෙස අපිට විශාල දෙයක් අවබෝධ කරගත හැකියි. අපි විපක්ෂයක් ලෙස සභාපතිතුමියට අසීරු අවස්ථාවේදී සහයෝගය දුන්නේ මේ බලප්‍රදේශයේ ජනතාවගේ කටයුතු ඉටු කිරීමට සභාව අවශ්‍ය නිසයි. පසුගිය කාල වකවානුව තුල මම මෙම සභාවෙන් ලයිට් එකක් හෝ දමා නොගත් පුද්ගලයෙක්. එදා විපක්ෂයට දැවැන්ත අසාධාරණයක් සිදුවුනා. එම විපක්ෂ කණ්ඩායම් වලට සාධාරණයක් ඉටු කිරීමට ඔබතුමියට යුතුකමක් වගේම වගකීමකුත් තිබෙනවා. මෙම කෙටි කාලය තුල මේ බලප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සංවර්ධනය ඉටු කිරීමට ඔබතුමියට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජනතා නියෝජිතයින් ලෙස අපි සභාවට එන්නේ ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන් සාකච්ඡා කර තීරණ ගැනීමට මිස අපි අතර වෛරී දේශපාලනය ක්‍රියාත්මක කිරීමට නොවෙයි. ආණ්ඩු පක්ෂය විපක්ෂය ලෙස පණතේ කොතනක හෝ සඳහන් වන්නේ නෑ. ජනමාධ්‍ය සභාවට පැමිණෙන්නේ සභාවේ තිබෙන කරුණු වාර්තා කිරීමටයි. මෙතෙක් කල් සභාවේ වාද භේද ඇතිවුන ද අපි හැසිරුනේ බොහොම ගෞරවණීය ලෙසයි. ජනතාව තීන්දුවක් ගන්නේ අපේ හැසිරීම නිරීක්ෂණය කිරීමෙනුයි. ගරු සභාපතිතුමිය මෙම කෙටි කාලය තුල තම වගකීම ඉතා හොඳින් ඉටු කර තිබෙන නිසා අපිට විශ්වාසය පළ කිරීමේ හැකියාව තිබෙනවා. අපි සියළු දෙනාම මෙතනට පැමිණියේ ගමට යම් සේවයක් කිරීමටයි. අපේ උප සභාපතිතුමා වැඩබලන සභාපතිවරයා ලෙස කටයුතු කරද්දී අලව්ව නගර සංවර්ධන යෝජනාවට මේ සභාවේ මන්ත්‍රීවරු සියළු දෙනාම සහයෝගය ලබා දුන්නා මිස කිසිවෙකුත් එයට විරුද්ධ වූයේ නෑ. මේ තුලින් අලව්ව සභාවට ලැබෙන ගෞරවය සහ අභිමානය මහජන නියෝජිතයින් ලෙස අපි සියළු දෙනාටත් ලැබෙනවා. අපිට තිබෙන්නේ මෙම ඉතිරි වී තිබෙන අවුරුද්දක කාලය තුල මේ ප්‍රදේශයේ ජනතාවට සේවය කිරීමයි. එම කටයුත්ත කිරීමට ඔබතුමියට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මා කෙරෙහි විශ්වාසය තැබූ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාට මගේ ගෞරවණීය ස්තූතිය පුද කරනවා. මගේ යම්කිසි ගුණාංගයක් ඔබ කවුරුන් හෝ දුටුවා නම් එහි ගෞරවය හිමි වන්නේ මගේ දෙමව්පියන්ටයි. කුඩා කල සිටම අපිව නිවැරදි දේ කිරීමටත් දුර දැක්මෙන් කටයුතු කිරීමටත් යොමු කලේ ඔවුනුයි. ඔබ තැබූ විශ්වාසය ආරක්ෂා කරමින් එදා මම සභාවේදී ප්‍රකාශ කලා වගේම ගරු මන්ත්‍රීතුමන්ලාගේ ආත්මාභිමානය රැකගෙන ගම තුල ජීවත් වීමටත් එමෙන්ම ජනතාව බලාපොරොත්තු වන සේවාව නිසියාකාරයෙන් ඉටු කර දීමටත් ඒ සඳහා සහාය ලබා දෙන ලේකම්තුමිය ප්‍රමුඛ නිලධාරී මණ්ඩලයට නිදහස්ව සහ නිවැරදිව කටයුතු කිරීමටත් අවශ්‍ය දේ කිරීමට සභාවේ නායකයා ලෙස මම නැවතත් ඔබ වෙත පොරොන්දු වෙනවා. ඔබ මා පිළිබඳව යමක් දැක එය මට පෙන්වා දෙනවා නම් එය මට ලබා දෙන ඉතාම

හොඳ සහයෝගයක් වගේම ආශිර්වාදයක් ලෙස මම දකිනවා. මාව මගේ දෙමාපියන් හැඩගස්වා තිබෙන්නේ යම් අභියෝගයක් ලැබුනා නම් එම අභියෝගය ජීවිතයටත් මගෙන් යමක් ලැබෙන අයටත් ශක්තියක් ලෙස පාවිච්චි කිරීමටයි. එම නිසා ඉදිරි කෙටි කාලයේදී අපි සියළු දෙනාම එකට එක්වී ශක්තිමත්ව අපේ අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සභාවේ සියළුම බලතල, නීතිරීති රැකගෙන අවශ්‍ය සේවය ඉටුකරමු යැයි ඔබ සියළු දෙනාටම මම මතක් කර සිටිමින් ඔබ සියළු දෙනාටම මගේ ගෞරවාදර ස්තූතිය පුද කරනවා.

ඒ අනුව ගරු පද්මා වැත්තෑව මැතිනියට මෙම සභාවේ පූර්ණ විශ්වාසය පළ කල යුතු බවටත්, එම අවස්ථාව සලසා දුන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, කුරුණෑගල දිස්ත්‍රික් නායක ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමාටත් මෙම සභාවේ ගෞරවාදර ස්තූතිය පුද කල යුතු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-5) ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/47 - 05 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ගල්වාරම, බුජ්ජොමුව මාර්ගය අපවත් වී වදාල මහෝපාධ්‍යාය සාහිත්‍ය ශූරී රාජකීය පණ්ඩිත දඹදෙණි හත්පත්තුවේ උප ප්‍රධාන සංඝනායක පූජ්‍ය තුඹුල්ලේ ශ්‍රී ධම්මානන්ද නා හිමියන් වහන්සේ නමින් නම් කිරීම සම්බන්ධව ශ්‍රී ධර්මෝධය මහ පිරිවෙනේ විහාරාධිපති පූජ්‍ය උණගලාවෙහෙර ගුණානන්ද ස්ථවිර වහන්සේ විසින් ලබා දුන් ලිපියට අනුව සිතියම් ගත කල මාර්ගයේ දළ සැලැස්ම ඉදිරිපත් කර ඇත. අලව්ව ගිරිඋල්ල පාරේ ගල්වාරම හන්දියෙන් ආරම්භ වන මෙම මාර්ගය බුජ්ජොමුව හන්දියෙන් අවසන් වන අතර මාර්ගයේ දිග මීටර් 3505.72 ක් හා පළල මීටර් 6.5 ක් වේ. මේ සම්බන්ධව විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කල යුතු බැවින් මහ සභා තීරණයක් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. මෙම මාර්ගය ගාමිණී ගුණදාස මහතාගේ කාලයේ දෙපැත්තෙහි ඉඩම් හිමියන්ගෙන් ඉල්ලාගෙන අඩි විසි ගණනක් දක්වා පළල මාර්ගයක් බවට පත් කලා. ඒ කාලයේ සිටම අපවත් වී වදාල නායක ස්වාමීන් වහන්සේ මෙම මාර්ගය සකස් කර දෙන ලෙස ඉල්ලීම් කලා. නාරද මන්ත්‍රීතුමා ඇතුළු පිරිසක් මෙම මාර්ගය කාපට් කර දෙන ලෙසට ලොකු උද්ඝෝෂණයක් කලා. එවිට මම මෙම මාර්ගය සෑදීමට මුදල් වෙන් කර සියළු කටයුතු සූදානම් කර තිබුණා. ඒ අනුව මම මෙම මාර්ගය සංවර්ධනය කලා. ප්‍රදේශයේ කීර්තිමත් සංඝනායක හිමිපානන් වහන්සේ නමක් වශයෙන් සංඝනායක පූජ්‍ය තුඹුල්ලේ ශ්‍රී ධම්මානන්ද නාහිමියන් වහන්සේගේ නමින් මෙම මාර්ගය නම් කිරීම වඩාත් සුදුසු වෙනවා. එමෙන්ම මීට කලින් මෙම ඉල්ලීම කරන විට මිරිහෙලිය සුසාන භූමියේ තිබෙන තේක්ක ගස විහාරස්ථානයේ වැඩකටයුතු වලට ලබා දෙන ලෙස ඉල්ලීමක් කලා. එම තේක්ක ගස මේ වන තුරුත් සුසාන භූමියේ බිම දමා තිබෙනවා. එම තේක්ක ගස මෙම විහාරස්ථානයට ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපවත් වී වදාල පූජ්‍ය තුඹුල්ලේ ශ්‍රී ධම්මානන්ද නා හිමියන් වහන්සේ කීර්තිමත් ස්වාමීන් වහන්සේ නමක්. උන්වහන්සේ ශාසනයට විශාල සේවයක් කලා. ඒ අනුව එම ඉල්ලීම සපුරාලමින් උන්වහන්සේගේ නමින් මෙම මාර්ගය නම් කිරීම සුදුසු බවට මම ද ප්‍රකාශ කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ස්වාමීන් වහන්සේ ඉතා ප්‍රසිද්ධ ස්වාමීන් වහන්සේ නමක්. දැනට විහාරස්ථානයේ සිටින නායක ස්වාමීන් වහන්සේත් බොහොම දැන උගත් ස්වාමීන් වහන්සේ නමක්. එම තේක්ක ගස අපෙන් ඉල්ලීම් කලත් මේ වන තෙක් ලබා දීමට නොහැකි වුනා. එය කෙසේ හෝ එම විහාරස්ථානයට ලබා දිය යුතුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

විහාරාධිපති ස්වාමීන් වහන්සේ යෝජනා කර තිබෙන්නේ මෙම මාර්ගය "පූජ්‍ය තුඹුල්ලේ ශ්‍රී ධම්මානන්ද නා හිමි මාවත" ලෙස නම් කරන ලෙසයි. ඒ අනුව එම නාමයෙන් එම මාර්ගය නම් කර අනුමැතියට යවමු. තේක්ක ගස ලබා ගැනීමට අවශ්‍ය වැඩකටයුතු මේ වන විට කෙරෙමින් පවතිනවා. ඒ අනුව ඉතා ඉක්මනින්ම එය එම විහාරස්ථානයට ලබා දීමට හැකියාව ලැබේවි.

ලංකාවේ ප්‍රථම වරට GIS ක්‍රමවේදය යටතේ බලප්‍රදේශය තුල තිබෙන සියළුම මාර්ග සිතියම් ගත කර තිබෙන්නේ අලව්ව ප්‍රාදේශීය සභාවයි. එමෙන්ම ඔබ සැමටම අය වැය ලේඛනයත් සමඟ තම තමන්ගේ කොට්ඨාශ වලට අයත් මාර්ග පිළිබඳව ලේඛනයක් ලැබී තිබෙනවා. ඉදිරියේදී මෙම මාර්ග නම් කිරීමේදී යම් ක්‍රමානුකූල බවක් ඇති කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් ගල්වාරම - බූජ්ජොමුව මාර්ගය පූජ්‍ය තුඹුල්ලේ ශ්‍රී ධම්මානන්ද නා හිමි මාවත නමින් නම් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-6) <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/47 - 06 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ආයතනයන්හි 2021/12/31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන් කර ඇත.

ඒ අනුව,

1. ප්‍රධාන කාර්යාලය / ප්‍රජා ශාලාව
2. මහරච්චිමුල්ල උප කාර්යාලය
3. කැප්පිටිවලාන උප කාර්යාලය / බෝයවලාන ප්‍රජා ශාලාව / බෝයවලාන සතිපොල/ බෝයවලාන වෙළඳ සංකීර්ණය
4. නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානය
5. අලව්ව මහජන ක්‍රීඩාංගනය
6. ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය
7. අලව්ව සතිපොල
8. පොදු වෙළඳ සංකීර්ණය
9. අලව්ව / බෝයවලාන / මහරච්චිමුල්ල පුස්තකාල 03
10. මාබෝපිටිය / මල්ගමුව/ මඩවල පෙර පාසල් 03

යන ආයතනයන්හි සමීක්ෂණ වාර්තා මේ ලිපිය සමඟ ගරු මහ සභාවට ඉදිරිපත් කර ඇත.

එම සමීක්ෂණ වාර්තා වලට අනුව සමීක්ෂණ මණ්ඩල විසින් පහත නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

I. ප්‍රධාන කාර්යාලයෙන් උප කාර්යාල සහ වෙනත් ස්ථානවලට ලබා දී ඇති භාණ්ඩ සහ උපකරණ එම ස්ථානවල වට්ටෝරු ලේඛනවලට ඇතුලත් කිරීම සහ ප්‍රධාන කාර්යාලයේ වට්ටෝරු ලේඛන වලින් එම භාණ්ඩ හා උපකරණ ඉවත් කිරීම.

II. ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කල යුතු භාණ්ඩ තවදුරටත් ඒ ඒ වේලාවට ප්‍රයෝජනයට ගන්නා ලේඛනයේම ඇතුලත් වී ඇති බැවින් නැවතත් එම භාණ්ඩ ගැලපෙන පරිදි වර්ගීකරණය කර ඉන්වෙන්ට්‍රි ගත කිරීම.

III අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් සියලු ආයතනයන්හි ඉන්වෙන්ට්‍රි ගතව ඇති ඇතැම් භාණ්ඩ වල මිල ගණන් සඳහන්ව නොමැති බැවින් තාක්ෂණ නිළධාරි ඇතුළු ත්‍රි පුද්ගල තක්සේරු කමිටුවක් මඟින් තක්සේරු කර ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කිරීමටත් පෙර පාසල් සඳහා පරිත්‍යාග වශයෙන් ලැබී ඇති භාණ්ඩ හා උපකරණ පරිත්‍යාග ලේඛනයේ ඇතුළත් කිරීම.

III. අළුත්වැඩියා කොට නැවත භාවිතයට ගත හැකි භාණ්ඩ / ද්‍රව්‍ය අළුත්වැඩියා කර නැවත භාවිතයට යොමු කිරීම.

IV. වටිනාකම ඉහල අගයක් ගන්නා නැවත මුද්‍රණය නොවන්නා වූ සංරක්ෂණය කල යුතු පොත් බැඳුම්කරණය කර පාඨක පරිශීලනයට යොමු කිරීම.

V. අස්ථානගත වී ඇති භාණ්ඩ / ද්‍රව්‍ය/ පොත් සඳහා අදාල චක්‍රලේඛ ප්‍රකාරව ඒ ඒ වකවානුවල සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.

VI. ප්‍රාදේශීය සභාවට අයත් සියලුම කාර්යාලවල , පුස්තකාල 03 හා පෙර පාසල් 03 හි ඇති ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ / ද්‍රව්‍ය වෙන්දේසි කිරීම.

VII. නැවත පරිහරණය කල නොහැකි භාණ්ඩ, ද්‍රව්‍ය / පොත් පොදු 47 ආකෘතිය ප්‍රකාරව ත්‍රිපුද්ගල අපහරණ කමිටුවක් ඉදිරියේ විනාශ කිරීම.

VIII. භාණ්ඩ සමීක්ෂණයෙන් පුස්තකාල තුනෙහි ඉවත් කරන ලද පරණ පත්තර තොග විකිණීම.

යනාදී වශයෙන් සමීක්ෂණ මණ්ඩල විසින් ඉහත නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහාත් පහත සඳහන් තක්සේරු හා අපහරණ කමිටු පත්කර ගැනීම සඳහාත් ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

<u>තක්සේරු කමිටුව</u>

| | | |
|---|---|---|
| කමිටු සභාපති | - | කේ.එම්. වසන්ත කුමාර මයා (ප්‍රධාන කළමණාකරණ සහකාර) |
| කමිටු සාමාජික | - | ආර්.එම්. අජන්තා රණසිංහ මිය (සංවර්ධන නිළධාරි) |
| කමිටු සාමාජික | - | ආර්. නාමල් ශෂිකාන්ත මයා, තාක්ෂණ නිලධාරී |

<u>අපහරණ කමිටුව</u>

| | | |
|---|---|---|
| කමිටු සභාපති | - | එම්.ඒ.ඒ.පී. මධුරප්පෙරුම මිය, සං. නිළධාරී (පන්නල ප්‍රාස) |
| කමිටු සාමාජික | - | එච්.ඒ.පී.පී. හෙට්ටිආරච්චි මිය, ප්‍රජා සං. නිළධාරී |
| කමිටු සාමාජික | - | කේ.ඒ.අයි.එස්. කළුආරච්චි මිය (සංවර්ධන නිළධාරි) |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව සමීක්ෂණ මණ්ඩල විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහාත් තක්සේරු හා අපහරණ කමිටු පත්කර ගැනීම සඳහාත් ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-7) <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/47 - 07 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැසිකිළි නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි ආධාර ලබා දීම වාර්ෂිකව සිදු කරනු ලබයි. ඒ අනුව මෙම වර්ෂයේද වැසිකිළි ආධාර ලබා දීමේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය බැවින් වැසිකිළිලාභීන් හට ලබා දිය යුතු ආධාර මුදල තීරණය කරගත යුතුව ඇත. පසුගිය වර්ෂ 02 ක කාලයක් එක් අයෙකු සඳහා රු. 35,000.00 ක මුදලක් අදියර තුනකින් ලබා දෙන ලදි. දැනට පවතින අධික මිල ගණන් හේතුවෙන් උපකරණ සහ ද්‍රව්‍ය මිලදී ගැනීමට වැඩි මුදලක් වැය කිරීමට සිදු වන බැවින් මෙම ආධාර මුදල රු. 40,000.00 ක් දක්වා වැඩි කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම යෝජනාව සංශෝධනය කර වැසිකිළි ආධාර මුදල රු. 50,000.00 ක් දක්වා වැඩි කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම වැසිකිළි වර්තමායට ගැලපෙන පරිදි අංග සම්පූර්ණව සකස් කිරීම වඩාත් හොඳයි. ඒ අනුව අධික මුදලක් වැය වන නිසා වැඩි ප්‍රමාණයකට නැතත් කිහිපදෙනෙකුට හෝ අංග සම්පූර්ණ වැසිකිළි ලබා දීම වඩාත් යෝග්‍ය වෙනවා.

ඒ අනුව 2022 වර්ෂයේ වැසිකිළි ආධාර මුදල රු. 50,000.00 ක් දක්වා වැඩි කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-8) <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/47 - 08 දරණ යෝජනාව</u>**

පළාත් පාලන කොමසාරිස්තුමා විසින් අප වෙත එවා ඇති ලිපියට අනුව කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව 2022.02.11 දින පැවැත්වීමට නියමිත අතර එදිනට සාකච්ඡා කිරීමට නියමිත අප බල ප්‍රදේශයට අයත් පහත සඳහන් ඉඩම් තුන පිළිබඳව අදාල නිරීක්ෂණ වාර්තා කඩිනමින් යොමු කරන මෙන් ඉල්ලීමක් කර තිබෙනවා.

01. අංක 984 විල්ගමුවවත්ත ග්‍රා.නි. වසම - කුඩා ඔය දිගේ වෙන් කල බිමෙන් පර්චස් 20 ක පමණ කොටසක අනුලා කටුපිටියගේ යන අය ස්ථිර නිවසක් සකසා අනවසරව පදිංචි ව සිටින අතර ප්‍රධාන මාර්ගයට ආසන්න රක්ෂිතය තුල මෙම නිවස පිහිටයි. බලපත්‍ර ලබා දෙන ලෙස ඉල්ලා සිටීම.

02. අංක 984 විල්ගමුවවත්ත ග්‍රා.නි. වසම - මාර්ගයට වෙන් කරන ලද ඉඩමක් තුල ඩී.එස්. කැතරින් ඩැනියෙල් යන අය ස්ථිර නිවසක් සකසා පර්චස් 30 ක පමණ කොටසක අනවසරව පදිංචිව සිටී. මාර්ගයට වෙන් කර තිබුන ද ඒ සඳහා භාවිතා නොවේ. බලපත්‍ර ලබා දෙන ලෙස ඉල්ලා සිටීම.

03. අංක 997 පහළ වලකුඹුර ග්‍රා.නි. වසම - ගල රක්ෂිතය සඳහා වෙන් කරන ලද අක්කර 06 ක පමණ කොටසක වසර 30 කට වැඩි කාලයක සිට පවුල් 07 ක් අනවසරව ස්ථිර නිවාස සකසා පදිංචිව සිටී. ජලය, විදුලිය වැනි පොදු පහසුකම් එම අය විසින් සපයාගෙන ඇති නමුත් ප්‍රවේශ පහසුකම නොමැත. අනවසර නියමානුකූල කරන ලෙස ඉල්ලා සිටීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මේ පුද්ගලයින් මෙම ඉඩම්වල පදිංචි වී ස්ථිර නිවාස සකස් කරගෙන මේ වන විට අවුරුදු ගානක් ගත වී තිබෙනවා. ඔවුන්ට ඉඩම් තිබුනානම් මෙසේ පැමිණ රක්ෂිතයක පදිංචි වන්නේ නැහැ. මහජන නියෝජිතයින් වශයෙන් අපේ වගකීම සහ යුතුකම වන්නේ මොවුන්ට අවශ්‍ය ඔප්පු ලබා ගැනීම සඳහා කටයුතු කිරීමයි. එම නිසා මෙම ඉඩම් එම පුද්ගලයන්ට ලබා දීම සම්බන්ධයෙන් එකඟතාවය ප්‍රකාශ කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. පසුගිය වර්ෂයේ අතිගරු ජනාධිපතිතුමාගේ නිවාස වැඩපිළිවෙල යටතේ මගේ කොට්ඨාශයේ උඩගන්කන්ද ප්‍රදේශයේ රක්ෂිතයක පදිංචි වී සිටින පවුලකට නිවසක් තනා දීමට උත්සාහ කලත් රක්ෂිතයට අයත් ඉඩමක් බැවින් ඔප්පුවක් නොමැති නිසා එම නිවස සාදා දීමට නොහැකි වුනා. එම නිසා මෙය ඉතාම හොඳ කටයුත්තක්. ඔබතුමිය විසින් සඳහන් කරන ලද ඉඩම් වලට අමතරව තවත් එවැනි ආකාරයට පදිංචි වී සිටින ඉඩම් කොටස් පිළිබඳව අවශ්‍ය නීතිමය කටයුතු සිදු කර ඔවුන්ට ඔප්පු ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉන්න තැනක් නොමැතිව කොතනක හෝ පදිංචි වී සිටිනවා නම් එම පුද්ගලයාව එතනින් එලියට දැමීම මහජන නියෝජිතයින් ලෙස අපේ යුතුකමක් නොවෙයි. අපි ජනතාව රකිනවා නම් ජනතාවට සේවය කරනවා නම් එසේ සිටින පුංචි භූමි ප්‍රමාණය හෝ නීත්‍යානුකූලව ඒ අයට පවරා දීමට අවශ්‍ය කරන සහයෝගය පක්ෂ භේදයකින් තොරව ලබා දිය යුතුයි.

එමෙන්ම ජයම්වත්ත රජයේ ඉඩමේ පර්චස් 20 ගණනේ ඉඩම් කැබලි හතරක් හෝ පහක් ඒ අවට පුද්ගලයින් විසින් අත්පත් කරගෙන සිටිනවා. මෙම ඉඩම් කොටස් ටිකත් නිරාකරණය කර ගත්තා නම් ඒවාත් ඉන්න තැනක් නැති තව පවුල් හතරකට පහකට දීමට හැකියි. එම නිසා මෙම ගැටළු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට දැනුම් දී ඒවා නිරාකරණය කර දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, විල්ගමුවවත්ත ග්‍රාම නිලධාරී වසමට අයත් මෙම නිවෙස මාර්ගයට වෙන් කර තිබෙන කොටසේයි තිබෙන්නේ. මෙම දිනවල මාර්ගය විශාල කර සකස් කර තිබෙනවා. නමුත් මෙම නිවෙස හසු වී නැහැ. එම නිසා ඔවුන්ට එම ඉඩම් කොටස් ලබා දීම සුදුසු බවට මමත් යෝජනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
විල්ගමුවවත්ත යනු 70, 77 යුගයේ ජනතාවට බෙදා දුන් ඉඩමක්. එමෙන්ම මෙම අනුලා කටුපිටිගේ ආබාධිත තැනැත්තියක්. මෙම ඉඩම් වල දීර්ඝ කාලයක් ජීවත් වූ පුද්ගලයින්ට එම ඉඩම් ඉතාම වටිනවා. පහළ වලකුඹුර ග්‍රාම නිළධාරී වසමට අයත් රක්ෂිතයේ පදිංචි වී සිටින පුද්ගලයිනුත් ඔවුන්ට හැකි ආකාරයට ජලය, විදුලිය වැනි පොදු පහසුකම් ලබාගෙන තිබෙනවා. ඔවුන්ට අවශ්‍ය ප්‍රවේශ මාර්ගයත් සකස් කරදීමට හැකි නම් එය ඉතාම වටිනවා.

ඒ අනුව මෙම ඉඩම්, ඒවාගේ පදිංචිව වී සිටින පුද්ගලයින්ට ලබා දීමට එකඟතාවය ප්‍රකාශ කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-9) ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/47 - 09 දරණ යෝජනාව**

2022 වර්ෂයේ නව වරිපණම් තක්සේරුව ක්‍රියාත්මක වීමත් සමඟ 2022 ජනවාරි මස 05,06,07,12, හා 13 වන දිනයන් හි තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කල විරෝධතා කැඳවීමට අදාල වාර්තාව සහ නව තක්සේරුවේදී විශේෂ දේපළ සහ වටිනාකම් සඳහන් නොවූ දේපල සම්බන්ධයෙන් ද වාර්තාව මේ දක්වා ලැබී නොමැත. මෙකී හේතුව නිසා වරිපනම් හිමිකරුවන්ට වර්ෂය මුල (ජනවාරි මස) ලබාදෙන 10% ක වට්ටම ලැබීමට නොහැකි වේ. නමුත් ඔවුන් විසින් 10% වට්ටම ඉල්ලා සිටිනු ලබයි. මේ නිසා විරෝධතා කැඳවූ වරිපණම් දේපල, විශේෂ දේපළ ලෙස සඳහන් වූ දේපළ සහ නව තක්සේරුවේදී වටිනාකම් සඳහන් නොවූ දේපළ සඳහා 10% වට්ටම වරිපනම් හිමිකරුවන්ට ලබා දීමට අවශ්‍ය කටයුතු සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම වරිපනම් ගාස්තු අධික ලෙස වැඩි වී තිබෙනවා. එයට යම් සහනයක් ලබා දීමට අපිට මැදිහත් වීමක් කල නොහැකිද?

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

වරිපණම් මුදල වැඩි යැයි විරෝධතා පල කර තිබෙන පුද්ගලයින්ගේ විරෝධතා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා තිබෙනවා. ඒ සම්බන්ධ වාර්තාව මෙතෙක් ලැබී නැහැ. එම නිසා එම වාර්තාව ලැබුනායින් පසුව ගත යුතු ක්‍රියාමාර්ගය කුමක් ද යන්න සලකා බලමු. කෙසේ වෙතත් මෙම වරිපණම් තක්සේරුවේ කිසියම් අවුල්තාවයක් තිබෙන බව පෙනෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වරිපණම් බදු එක විට තුන්ගුණයකින් වැඩි වී තිබෙනවා. මේ ක්‍රමයේ අඩුපාඩුවක් තිබෙන බව පෙනෙනවා. මෙහිදී දෝෂාරෝපණ එල්ල වන්නේ ජනතා නියෝජිතයින් ලෙස අපිටයි. ඔබතුමිය විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව විරෝධතා කැඳවූ වරිපණම් දේපල, විශේෂ දේපළ ලෙස සඳහන් වූ දේපළ සහ නව තක්සේරුවේදී වටිනාකම් සඳහන් නොවූ දේපළ සඳහා 10% වට්ටම වරිපනම් හිමිකරුවන්ට ලබා දීමට අවශ්‍ය කටයුතු සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-10) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා විසින් කරනු ලබන අංක 06/47 - 10 දරණ යෝජනාව**

2022 අයවැය යෝජනා මගින් මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදන වලින් පහත සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

- හඟවත්ත නිමල් මහතාගේ කඩය අසල මාර්ගය පසු පුරවා සංවර්ධනය කිරීම - රු. 350,000.00
- පොරමඩල ඇලපල්ල මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම - රු. 100,000.00
- පොරමඩල ප්‍රාථමික විද්‍යාලය හරහා බඹරගල දක්වා මාර්ගය පස් පුරවා සංවර්ධනය කිරීම - රු. 100,000.00
- වඩුවාව හපුගහයාය මාර්ගය පස් දමා සංවර්ධනය කිරීම - රු. 50,000.00
- පොරමඩල දේවාලය අසල මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම - රු. 100,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05-11) ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා විසින් කරනු ලබන අංක 06/47 - 11 දරණ යෝජනාව</u>**

2021 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වඩුවාව දූම්මලදෙණිය මාර්ගයට කොන්ක්‍රීට් කිරීමට රු. ලක්ෂ 1 ක් වෙන් කර තිබුන ද සිමෙන්ති අගය හා අධික මිල නිසා එය සංශෝධනය කර බොරළු දැමීමට අවශ්‍ය කටයුතු සැලසීම සුදුසු බවට යෝජනා කරමි.

එමෙන්ම 2022 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වඩුවාව අංක 05 කොට්ඨාශය සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

- වඩුවාව දූම්මලදෙණිය මාර්ගය බොරළු දැමීම - රු. 200,000.00
- වඩුවාව දංගොල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම - රු. 200,000.00
- පොරමඩල 02 කණුව කොන්ක්‍රීට් මාර්ගයේ ලොකු නන්දන මහතාගේ වෙළඳසැල අසල කොටස කොන්ක්‍රීට් කිරීම - රු. 100,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම මාර්ග සංවර්ධනය කිරීමේදී ඒවා පෞද්ගලික මාර්ග ලෙස පවසනවා. නමුත් මම සෑම යෝජනාවක්ම ගෙන ආවේ ප්‍රාදේශීය සභාවට පවරාගෙන තිබෙන මාර්ග සම්බන්ධවයි. මෙම වඩුවාව දූම්මලදෙණිය මාර්ගයත් ප්‍රාදේශීය සභාවට පැවරීමට කටයුතු කලා. මීට අමතරව වඩුවාවේ එවැනි මාර්ග කීපයක්ම සභාවට පැවරීමට මම කටයුතු කලා. මෙසේ පාරවල් පවරා ගැනීමට බලය තිබෙන්නේ ප්‍රාදේශීය සභාවටයි. එම බලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට යන්නේ කෙසේදැයි මම දන්නේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මාර්ග සම්බන්ධ නිසි බලධාරියා වන්නේ ප්‍රාදේශීය සභාවයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඇතැම් මාර්ග වලට මුදල් වියදම් කිරීමට තොරතුරු සනාථ කිරීමේදී එය සිදු කිරීමට තිබුනේ ප්‍රාදේශීය සභාව හරහායි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
විවිධ ආයතන වලට ඇදගෙන තිබෙන සභාව සතු බලතල ආපසු ලබා ගැනීමට අපිට සිදු වී තිබෙනවා. ඒ සඳහා ඔබ සියළුදෙනාගේම සහයෝගය ඉල්ලා සිටිනවා. අපි මාර්ග සංවර්ධනය කිරීමේ කටයුතු වලදී ප්‍රාදේශීය සභාව සතු මාර්ගය අවසාන වන තුරු සංවර්ධනය කිරීමට එකඟ වෙමු යැයි මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඉහත සංවර්ධන යෝජනා සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-12) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා කරනු ලබන අංක 06/47 - 12 දරණ යෝජනාව**

2022 අයවැයෙන් වෙන් කරන ලද මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පහත සංවර්ධන යෝජනා සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

- නුගවෙල ග්‍රාම නිලධාරී වසමේ බතලහේන මාර්ගය සංවර්ධනය කිරීම - රු. 200,000.00
- නුගවෙල සායන මධ්‍යස්ථානයේ අළුතින් ඉදිකරන ලද කොටසේ ආවරණ දැල් සකස් කර ඉතිරි අඩුපාඩු සම්පූර්ණ කිරීම - රු. 100,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** ඇස්තමේන්තු ඉදිරිපත් කිරිම- නැත

**07.නිවාඩු ලිපි ඉදිරිපත් කිරිම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

| | | | |
|---|---|---|---|
| 1. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඒ කරුණාරත්න මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම ඒකමතිකව සභා සම්මත විය.

**08.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

**(08.1) මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.02.01 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.02.01 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.02.01 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාවඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.2)කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.02.01 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.02.01 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.02.01 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.3)ප්‍රසම්පාදන කාර්ක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.01.21 දින පැවති ප්‍රසම්පාදන කාර්ක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.01.21 දින පැවති ප්‍රසම්පාදන කාර්ක සභා රැස්වීම් වාර්තාව වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.01.21 දින පැවති ප්‍රසම්පාදන කාර්ක සභා රැස්වීම් වාර්තාව වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව හා ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කිරීම</u>**

**<u>9.1. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා .

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**9.2. ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මාසික සභා වාර්තාවේ ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් අපිට ලැබී තිබෙනවා. ඒ පිළිබඳව එම නිලධාරීන්ට ප්‍රණාමය පුදකරනවා. එහි කාරණා දෙකක් පිළිබඳව අවධානය යොමු කල යුතුයි. වැලිහිඳ ග්‍රාමයේ ඩයලොග් කුළුණ ඉදි කිරීම සම්බන්ධව ව්‍යාපාරිකයින් දෙදෙනෙකු විරෝධතාවය ප්‍රකාශ කලා. නමුත් එය ඉදි කිරීමට ප්‍රදේශවාසීන්ගේ විශාල ප්‍රසාදයක් තිබෙනවා. විශේෂයෙන්ම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා එය වඩාත් වැදගත් වෙනවා.එම නිසා එම ව්‍යාපාරිකයන්ට හානියක් නොවෙන ආකාරයට එම කුළුණ කෙසේ හෝ එම ප්‍රදේශයේ ස්ථාපිත කරන ලෙස ජනතාව වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා.

එමෙන්ම ඇළ මාර්ග සීමාවෙන් දිවෙන මාර්ග පිළිබඳව මෙම සභාවේ යෝජනාවක් සම්මත වුනා. මෙය යොමු කර තිබෙන්නේ මහරච්චිමුල්ල සහ අලව්ව ගොවිජන ව්‍යාපෘති නිලධාරීන්ට පමණයි. එම නිසා මෙය අදාල විෂය භාර අමාත්‍යවරයාගේ අවධානය සඳහා ද යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ඩයලොග් කුළුණ ඉදිකිරීම සම්බන්ධව සභාවට යෝජනා කිහිපයක්ම ආවා. මේ සම්බන්ධයෙන් සාකච්ඡාවකුත් පැවැත්වුවා. මේ සඳහා වෙනත් තැනක් තොරා ගැනීම සුදුසු යැයි අවසාන තීන්දුවකට ආ බව සඳහන් වෙනවා. කැමිලස් ප්‍රනාන්දු මහතා මේ ප්‍රදේශයට ඉතාමත් ප්‍රයෝජනවත් කෙනෙක්. එතුමා විසින් ව්‍යාපාරික කටයුතු වලට බාධාවක් නොවෙන ස්ථාන කිහිපයක් යෝජනා කර තිබෙනවා. එතුමා යෝජනා කර තිබෙන තමාගේ ඉඩමේ යෝග්‍ය ස්ථානයේ ඉදි කරනවා නම් ඩයලොග් ආයතනයෙන් ගෙවන මාසික කුලිය අලව්ව

ප්‍රාදේශීය සභාවේ ආදායමක් ලෙස පරිත්‍යාග කිරීමට කැමති බව ප්‍රකාශ කර තිබෙනවා. මෙය ඉතාමත් වටිනා යෝජනාවක්. මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම කුළුණ සම්බන්ධයෙන් කැමිලස් මහතා ඉතා හොඳ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මොහු පොදු කටයුතු වලට උදව්කරන ව්‍යාපාරිකයෙක්. එම නිසා එම යෝජනාව අදාල ස්ථාන වලට යවන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අපි මොවුන් කැඳවා සාකච්ඡා කලේ ප්‍රදේශයේ තිබෙන කර්මාන්ත ආරක්ෂා කල යුතුයි කියන තැන සහ එමෙන්ම මෙම විදුලි සංදේශන පද්ධතිය ජනතාවට ඉතාම අත්‍යාවශ්‍ය දෙයක් බවත් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට අත්‍යාවශ්‍ය කාරණාවක් බවත් මුල් කරගෙනයි. එම නිසා මෙම කාරණා දෙකටම මුල් තැන දී කටයුතු කල යුතු බවට තීරණය කලා. මෙසේ කුළුණ ඉදිකිරීමට සුදුසු තැන් සඳහා ඉදිරිපත් වූ යෝජනා විදුලි සංදේශන නියාමන අධිකාරියෙන් පරික්ෂා කර බලා තීන්දු කල යුතු බව ඔවුන් පැවසුවා. ඒ අනුව ඊට අදාල ලිපි දැන් සකස් වෙමින් පවතිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙහිදී අපේ සභාවට ආදායමක් ලැබීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම දැනට රෝගී වී සිටින නාරද මන්ත්‍රීතුමාටත්, කරුණාරත්න මන්ත්‍රීතුමාටත් ඉක්මන් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ වන විට මගේ ප්‍රදේශයේ කාපට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. මෙම මාර්ගය සභාවට අයත් මාර්ගයක්. වැසි කාලයට මෙම මාර්ගය දිගේ වතුර ගලා යනවා. නමුත් මෙය සංවර්ධනය කිරීමේදී බෝක්කු කැට ඉතා අඩු ප්‍රමාණයකුයි දමනු ලබන්නේ. මගේ දැඩි ඉල්ලීම මත බෝක්කු 05 ක් දමා තිබෙනවා. නමුත් තව බෝක්කු කැට දැමීමට අවශ්‍ය තැන් තිබෙනවා. එම අවශය ප්‍රමාණය නොදැම්මහොත් දමන කාපට් එක විනාශ වී යා හැකියි. එම නිසා සභාවෙන් මෙම මාර්ගයට බෝක්කු කැට ප්‍රමාණයක් ලබා දීමට හැකි නම් බොහෝ වටිනවා. ඒ පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

එමෙන්ම අග්බෝව ග්‍රාම සේවා වසමේ පදංචි එල්. පී. නන්දාවතී මහත්මිය විසින් වැසිකිලි ආධාරයක් ඉල්ලා තිබෙනවා. ඒ පිළිබඳවත් සලකා බලා ඇයට එම ආධාරය ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අපි මේ වන විට කාණු කැට ඉල්ලා තිබෙනවා. නමුත් තවම ලැබී නැහැ. ඒවා ලැබීමෙන් පසුව ලබා දිය හැකියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එට්සලාට් සමාගමේ සහ ටීගෝ සමාගමේ අවුරුදු 03 ක් පමණ කුළුණු සම්බන්ධව මම කටයුතු කලා. කුළුණක් ඉදි කිරීම සඳහා අවසර ලබා දෙන්නේ විදුලි සංදේශන කොමිෂන් සභාව විසිනුයි. ඒ අනුව ඔවුන් පරික්ෂා කර බලා සුදුසු තැනක් නම් කරාවි.

එමෙන්ම තවත් ඉල්ලීමක් කිරීමට කැමතියි. අයවැයේ වැඩ ලක්ෂයේ යෝජනා වලට අපි මේ වන විට මුල්ගල් තබා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දී තිබෙන්නේ කාර්තුවේ වැඩ එම කාර්තුවේම අවසන් කරන ලෙසයි. එම නිසා ප්‍රාදේශීය ලේකම්තුමියට දැනුම් දී අවශ්‍ය ලියකියවිලි ගෙන්වාගෙන කඩිනමින් ඒවා ඇස්තමේන්තු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

එම වැඩ විෂයන් එවන ලෙසට ඉල්ලීමක් කර ලිපියක් සකස් කර අපි ප්‍රාදේශීය ලේකම්තුමියට යවා තිබෙනවා. නමුත් එයට මේ වන තෙක් පිළිතුරු ලැබුනේ නැහැ. ඒවා එවීම ප්‍රමාද වෙනවා නම් මන්ත්‍රීතුමන්ලා තම තමන්ගේ අනුමත වූ වැඩ විෂයන් ටික අපිට ලබා දෙන්න. එවිට අවශ්‍ය කටයුතු සිදු කරන්නම්.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ජා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රිතුමියන්ලාටත්, මාධ්‍යවේදී සහෝදරයින්ටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 5.30 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/02/08
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.